භක්ති ප්‍රබෝධනය

පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 ජනවාරි - පෙබරවාරි | 125 වන කාණ්ඩය - 01 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2023

## ඇදහිල්ලට අභියෝග



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# අකීකරුද ඔබේ සිතත්...

ගී පද - බන්ධුල නානායක්කාරවසම්
තනු නිර්මාණය - එච්. එම්. ජයවර්ධන
ගායනය - විශාරද එඩ්වඩ් ජයකොඩි



අකීකරුද ඔබේ සිතත් වෙරළේ පෙරලෙන රළ වාගේ
අකීකරුයි මගේ සිතත් හමනා සැඩ සුළඟක් වාගේ
ඒ සුළඟේ පාව යන්න වලා රොදක් සේ නැගෙන්න //

සුළඟ සැරෙන් හමනා විට
ගිනිදැල් තව තව ඇවිලේවී
ඒ ගින්දර නිවාලන්න
ඒ සුළඟම විවරණ දේවී

අකීකරුද ඔබේ සිතත්...

වෙරළේ රළ සැඩ වුවොත්
ඔරුකඳ කණපිට පෙරළේවී
නිසල වුණොත් ඒ රළ පෙල
සුවසේ අප මෙගොඩ කරාවී

අකීකරුද ඔබේ සිතත්...

සිත නම් වූ "ගෙවත්ත"ට සීමා මායිම් නොමැත; වැට කඩොලු නොමැත. නොසලකා හැරියොත් ඉතා පහසුවෙන් වල්බිහි වන්නට පුළුවන. එසේ වූ නමුත්, සිත නම් වූ "ගෙවත්ත" පිරිසිදුව තබා ගැනීමට මිනිස් අපට හැකියාවක් මෙන්ම වගකීමක් ද ඇත. එහෙත් අවාසනාවකට මෙන්, තම සිත හික්මවා ගනු වෙනුවට, වෙරළේ පෙරළෙන රළ සේ, හමනා සැඩ සුළඟ සේ අකීකරුව දිව යන්නට සිතට ඉඩ දීම බොහෝ දෙනකුගේ ජීවිත තුළ දක්නට ලැබේ.

සුළඟ සැරෙන් හමනා විට - ගිනි දැල් තව තව ඇවිලේවී
වෙරළේ රළ සැඩ වූවොත් - ඔරුකඳ කණපිට පෙරළේවී

දැඩි සුළි සුළඟක් සේ, සැඩ රළ පහරක් සේ, පාලනයකින් තොරව ඉබාගාතේ සැරිසරන්නට හැඟීම්වලට ඉඩ දිය යුතු ද? හැඟීම් පාලනය කර ගනු නොහැකිව දිවි ගෙවීම රචකයා සමාන කරන්නේ ඇවිලෙන මහා ගින්නකට ය; පෙරළුණු ඔරුකඳකටය. එහෙත් ඒ "ගින්න" නිවිය හැක්කේ, "ජීවිත ඔරුව" හරි අතට ඔසවා තැබිය හැක්කේ , අන් කවරකුටවත් නොව තමාටමය.

ඒ ගින්දර නිවාලන්න - ඒ සුළඟම විවරණ දේවී
නිසල උණොත් ඒ රළ පෙළ - සුවසේ අප මෙගොඩ කරාවී

ජීවිතය යනු තීරණ ගැනීම් රාශියක එකතුවක් ලෙසට විග්‍රහ කළ හැකිය. ඒ තීරණ ගැනීම් අප කරන්නේ ප්‍රඥාවන්තව ද? එසේත් නැතිනම් හැඟීම්බරව ද? හැඟීම්බරව, සසල වූ සිතින් ගන්නා වූ බොහෝ තීරණ, අතිශයින්ම වැරදි තීරණ වූ අවස්ථා තිබෙනවා නොවේද? සසල වූ සිත නිසල වූවොත් ප්‍රඥාවන්ත ව තීරණ ගැනීම පහසු වේ. රචකයාගේ අත්දැකීමද එයයි.

ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා
'මැසනඩ් යොවුන් පියස'
සා. වින්සෙන්ති නිවාසය, මග්ගොන.

# භක්ති ප්‍රබෝධනය

2024 ජනවාරි - පෙබරවාරි

**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

අචල රූපසිංහ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 වසර 125 සපුරන භක්ති ප්‍රබෝධනයේ....
- කැලිස්ටස් ජයමාන්න

6 ජුබිලි වසර සඳහා තරග දැන්වීම

7 කාව සිත - චමත් බී. පයාගල

8 ඇදහිල්ල අන්ධ... - මහාචාර්ය ඇන්ටන් මීමන

10 අප බොරු සාක්ෂිකරුවෝද
- වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්

11 ආගම උපකරණයකි - සපුගස්කන්දේ රංජිත්

12 ඇදහීමට අභියෝග ඇත...
- ගරු සාර්ටෝ නෝනිස් පියතුමා

13 අමිතගේ හද ගැස්ම - සී. අමිත

14 ඇදහිල්ලෙන්... - ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා

18 **Challenges towards faith...**
- Rev. Fr. Michael Devin Coonghe IVDei

19 ගුටිකන්න බෑ... - එරන්දි එම්. සේනාරත්න

20 මුනිවර වරුණ 05
- ගරු කේ. සුමිත් සමීර ප්‍රනාන්දු සහෝදරතුමා

21 ඇදහිල්ලට අභියෝග - ඩිලීෂියා තිලකරත්න

22 ඇදහිල්ලට අභියෝගයක් වූ මූලධර්මවාදය
- බුද්ධික සඳරුවන් සිල්වා

24 චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා

25 අගයමු මිනිසත් බව - ඇග්නස් සියඹලාපිටිය

26 පුංචි විකුම් - තරංගනි රෙසිකා

27 ප්‍රහේලිකා අංක - 77
- ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා


28 ප්‍රහේලිකා අංක 75 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය
විශ්ව සහා ඉතිහාසය XV - එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

ඇතැම්හු අන්තවාදී මත දරමින් වෛරය වපුරන්නේ මේ ආගම සහ ධර්මය පිළිබඳ යථාර්ථය නොදැනය. ආගමක් පෞද්ගලික වන අතර ධර්මය විශ්වීය වේ. බුදුනු, කිතුනු, ඉස්ලාම් සහ මෙකී නොකී ඕනෑම බැතිමතකුට ධර්මය පොදු වන අතර ආගම් විරෝධීන්ටද මෙය පොදු වන්නේය. ධර්මය යනු විශ්වයේ ස්වභාවයයි. කතෝලිකයකු මේ ධර්මයට දෙවියන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ හෝ ශුද්ධ ත්‍රිත්වය ලෙස ආමන්ත්‍රණය කරන විට අන්‍යාගමිකයකු මේ ධර්මය තවත් අයුරකින් ආමන්ත්‍රණය කරයි. එහෙත් මේ සියල්ලන්ගේම ආගම් විවිධ වුවත් ධර්මය එකකි. එසේනම් අප ආගම්, ජාතීන් හෝ වෙනත් සංකල්පයක් මත බේදී ක්‍රිස්තුස් වහන්සේ දෙසූ ප්‍රේමය, බුදුන් වහන්සේ දෙසූ මෛත්‍රිය ඉවතලා එකිනෙකාට නිගා කරගනිමින් ඇණ කොටාගන්නේ මන්ද? අප සැබෑ ඇදහිල්ලෙන් අවදිව ධර්මයේ හැසිරිය යුතු මොහොත දැන් පැමිණ ඇත. ඉතින් වර්තමානයේ පවතින යුදගිනි, දූෂණ මධ්‍යයේ මෙවර කවරයේ කතාව අපව අවදි කරන්නේ ඇදහිල්ලට ඇති අභියෝග මැඩලන අභියෝගාත්මක ඇදහිල්ලක තිර වන්නටය.

**අචල රූපසිංහ**

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය වසරකට - රු. 850.00
(නව මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(නව මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year
(Including new Postage)

Rs. 1700.00 for two years
(Including new Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

# ඇදහිල්ලට අභියෝග

## හෙළිදරව්ව

ඇදහිල්ල දෙවියන් වහන්සේගෙන් ලැබෙන තිළිණයක් යන්න අපි අසා ඇත්තෙමු. ඕනෑම ත්‍යාගයක් ආරක්ෂා කිරීමේ වැඩි වගකීම පැවරෙන්නේ ත්‍යාගය ලැබුණු පුද්ගලයාට ය. එලෙසම ඇදහිල්ල නමැති ත්‍යාගය ලැබූ ඇදහිලිවන්තයාට එය ආරක්ෂා කර ගැනීම වර්තමාන සමාජය තුළ අභියෝගාත්මකය. සමහරුන්ගේ ඇදහිල්ල අර්බුදයක පවතී. සිය ජීවිතයේ ගැටලුවලට විසඳුම් සොයා ගැනීමට නොහැකිව උකටලීව කල්ගත කරති. එනිසා සංකීර්ණ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට ඔවුන්ට සිදුවී ඇත. එය නිවැරදිව තක්සේරු කර නොගතහොත් තමන්ගේ ඇදහිල්ල බිඳ වැටෙනු ඇත. ඇදහිල්ල බිඳ වැටෙන විට එකිනෙකා භේද බින්න වන්නාහ. බොරු දිවැසිවරුන්ගේ අදහස් උදහස්වලට බොහෝ දෙන මුළා වන්නාහ. අධර්මය වර්ධනය වන විට බොහෝ දෙනකුගේ ප්‍රේමයේ ජීවිතය පිරිහෙන්නේය (මතෙව් 24: 10-12 පරිශීලනය කරන්න). ඇදහිල්ලට බලපාන අභියෝග රාශියකි. ඒ අතර ඇතැම් අයට සිය දැනුම, බලය, ධනය සහ නිලය ඇතුළු විනයකින් තොරව අනවබෝධයෙන් මෙහෙයවීම ප්‍රධාන වේ.

විවිධ ක්ෂේත්‍රවලින් දැනුම ගැනීම අද පෙරටත් වඩා පහසු වී ඇත. දැනුම ලැබෙන විට සමහරු තර්කයෙන් පමණක් සියල්ලට පිළිතුරු සෙවිය හැකි බව සිතති. එහෙත් දහමක අන්තර්ගත ඇතැම් "විශ්වාසයේ සත්‍යතාවන්" තර්කණයට ගෝචර නොවේ. තර්ක විතර්ක ඉදිරිපත් කළ පමණින් ඒවාට සම්පූර්ණ පිළිතුරු බොහෝ විට නොලැබේ. එනිසා තර්ක කරගෙන යන විට තමන්ටත් හොරා තමන් අතරමං විය හැකිය. මන්ද දෙවියන් වහන්සේගේ මැවිල්ලේ සැලැස්ම මෙන්ම උන්වහන්සේගේ ප්‍රඥාව, යුක්තිය, ධර්මිෂ්ඨකම, කරුණාව, ප්‍රේමය අසීමිතය. අසීමිත දෙවියන් වහන්සේගේ දේව අනාවරණ සියල්ලම සීමිත මනසක් ඇති මනුෂ්‍යයාට කිසිදා සම්පූර්ණයෙන් ග්‍රහණය කර ගැනීමට නොහැකිය. අප කිසියම් අවකාශයකට සහ කාලයකට කොටුවන නිසාම දහමේ අන්තර්ගත ඇතැම් කාරණ අභිරහස්මය ස්වරූපයෙන් පවතී. ඒවා මුළුමනින් තේරුම්කර ගැනීමට හැකියයි සිතීම, සැක සහිතව දේව අනාවරණයන් ගැරහීමට ලක් කිරීම වැනි ක්‍රියා පරිපාටි හරහා ඇතැම් පුද්ගලයන් සංකීර්ණ ප්‍රශ්න රාශියකට අවතීර්ණ වී මංමුළා වේ. ශු. ත්‍රිත්වය තේරුම් ගැනීමට උත්සාහ කළ ශු. අගෝස්තීනු මුනිතුමා දැඩි අපහසුතාවකට පත්විය. අවසානයේදී, මුහුදු වෙරළේ පෙනී සිටි කුඩා දරුවා ශු. අගෝස්තීනු මුනිතුමාගේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට උපකාර කළ අයුරු ඒ කථාව අසා ඇති හැමට වටහා ගත හැකිය. දැනුමෙන් පිම්බී සිටින අහංකාර සිතැත්තන්ට විය හැකි අනතුර ක්‍රිස්තුස් වහන්සේද අවධාරණය කළ සේක. "ස්වර්ග යටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස, ඔබවහන්සේ මේ කරුණු පැණවතුන් සහ නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි" (මතෙව් 11:25). පණ්ඩිතයන්ගේ සහ ඥානවන්තයන්ගේ තර්කණය නිසාම දේව අනාවරණයන්ට සුසරවීමට ඇති ඉඩකඩ තමන් විසින්ම අහුරාගෙන ඇත. විධිමත් අධ්‍යාපනය හරහා එක විෂයක් හෝ විෂයන් කීපයක් හදාරා ලබා ගන්නා අවබෝධය විෂයානුබද්ධ දැනුමකි. එහෙත් එම දැනුම විශ්වයේ පරම සත්‍යතාවන් තෝරා බේරා ගන්නට ප්‍රමාණවත් නැත.

මීට වසර ගණනාවකට පෙර කෑගල්ලේ, සාන්ත මරියා දේවස්ථානයට අයත් සංඝයට ධර්ම විවේකයක් සිදු කරන්නට අපි ගියෙමු. එහිදී, දරුවන්ගේ ඥානකාන්තිය හමාර කරන දිනයේදී, නවවන වසරේ දැරියක් මා හමුවී හඬන්නට පටන් ගත්තාය. ඇය පැවසුවේ "අපේ ටියුෂන් පංතියේ විද්‍යා සර් අද අපව සමච්චලයට ලක් කළා. සර් කිවුවා මේගොල්ලන්ගෙ දෙවියො දවස් 6න් ලෝකයත් මිනිස්සුන්වත් මවල හත්වන දවසේ රෙස්ට් කරල කියලා, මහ හඬින් සිනාසී, එහෙම දෙවි කෙනෙක් ලෝකය මවල නැහැ, ජීවිතය මෙලොවට ජනිත වන්නේ චාල්ස් ඩාවින් පවසන පරිදි පරිණාම වාදයේ ප්‍රතිඵලයක් කියා කිව්වා".

මම ඇයට පැහැදිලි කළේ, ප්‍රථමයෙන්ම මේ කියන ගුරුතුමා ගුරුවරයකු සහ වැඩිහිටියකු වශයෙන් තමාගේ ශිෂ්‍යාවක් අදහන ආගමික විශ්වාසයනට ගැරහීම සහ ඇයව අපහසුතාවට පත්කිරීම සදාචාරාත්මක නොවන බවය. දෙවනුව, හෙතෙම විද්‍යාව ටිකක් දැනගත් පමණින් ශු. බයිබලයේ මැවීමේ කථා මතුකරන ගැඹුරු පණිවුඩය පිළිබඳව අබමල් රේණුවකවත් දැනීමක් නැති අතර ඔහු ශු. බයිබලය ද හදාරා නොමැති බව ඇයට වටහා දුනිමි. විද්‍යාව සහ ශු. බයිබලයේ පණිවුඩය මොනයම්

ආකාරයකින්වත් ගැටෙන්නේ නැත යන්න පෙන්වා දුනිමි. ඔහුගේ තර්කය සහ නිගමනය අනවබෝධයෙන් කළ අදහසක් බව තවදුරටත් මේ දියණියට මම පහදා දුනිමි. එබැවින් අපට දැනුම ලබාදෙන වෙනත් විෂයන් 3 ක් ඔස්සේ අපි මේ ගැටලුව සාකච්ඡාවට භාජනය කරමු.

**විද්‍යා විෂයඃ** ජල අණුවක් සෑදී ඇත්තේ කෙසේ ද? හයිඩ්‍රජන් පරමාණු දෙකක් සහ ඔක්සිජන් පරමාණු එකක් එකතුවීමෙනි. 2H + 1O = $H_2O$ (ජල අනුව) මේ සංසිද්ධිය විද්‍යාගාරයක නැවත නැවත එදා මෙන් අදත් සිදුකර පෙන්වීමට පුළුවන.

**ගණිතයඃ** 8 x 5 = 40, 1000 ÷ 10 = 100 ගණිතය විෂය හදාරන ඕනෑම කෙනෙක් ඉලක්කම් එකතු කිරීම, වැඩි කිරීම, බෙදීම සහ අඩු කිරීම කිසියම් ක්‍රමවේදයකට අනුව හදාරයි. ගණිතය යනු එක විෂයක් වන අතර එයින් ඕනෑම විෂයකට පිළිතුරු සැපයීමට නොහැකිය.

**ඉතිහාසයඃ** දුටුගැමුණු, ධාතුසේන යන රජවරුන් අනුරාධපුරයේ සිටි බවට පුරා විද්‍යා තොරතුරුවලින් සහ අතීතයේ ඔවුන් ගොඩ නගන ලද නිර්මාණ හොඳින් අවබෝධකර ගන්නට නම් අප අනුරාධපුරයට ගොස් එම යුගයට අයත් ඔවුන් කළ කී දෑ කියවමින් හා දැකබලා ගනිමින් තේරුම් ගැනීමට අද පවා පුළුවන.

මේ අනුව විද්‍යාව, ගණිතය, ඉතිහාසය යනු එකිනෙකට වෙනස් විෂයන් ය. විද්‍යාව ඉගෙනගත් පමණින් ඉතිහාසයේ ප්‍රශ්නවලට පිළිතුරු දිය නොහැකිය. ගණිතය හැදෑරූ පමණින් විද්‍යා විෂයේ හෝ ඉතිහාසයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය නොහැකිය. එබැවින් අප වටහාගත යුත්තේ විද්‍යා විෂය හැදෑරූ පමණින් ශු. බයිබලයේ දේව අනාවරණ තේරුම් ගැනීමට කෙනකු අපොහොසත් වන බවය. ශු. බයිබලයේ ඓතිහාසික කාරණ ඇතත් එය ඉතිහාස පොතක් ද නොවේ. ඉතිහාසය දැනගත් පමණින් ශු. බයිබලය තේරුම් ගත නොහැකිය. එනිසා විද්‍යාත්මක හෝ ඉතිහාසයේ තොරතුරු ශු. බයිබලය තුළින් සෙවීමට හෝ විමසීමට උත්සුකවීම, තර්ක කිරීම අනුචණ ක්‍රියාවකි. නිෂ්ඵල කාර්යයකි. ශු. බයිබලයේ සංසිද්ධි විද්‍යාත්මක විෂයන් හෝ වෙනත් විෂයක් තේරුම් ගන්නා ආකාරයෙන් ප්‍රශ්න ඇසීම යනු මත්ස්‍යයන්ට සහ මිනිසුන්ට එකට ජීවත් විය හැකි පරිසරය කුමක්ද යන්න අසනවා වැනිය. එවැනි ප්‍රශ්නයක් අසන විට පිළිතුරක් දිය නොහැකිය. නොගැලපෙන දත්ත දෙකක් ඉදිරිපත් කරමින් අසන ප්‍රශ්නය වැරදි වන නිසා නිවැරදි පිළිතුරක් සොයා ගැනීමට අපහසුය.

මුළු ශු. බයිබලය පුරාම දිවෙන ප්‍රධාන තේමාව වනුයේ මනුෂ්‍යයාගේ ගැලවීමේ පණිවුඩයයි. ශු. බයිබලය තුළ අපට හමුවන්නේ දෙවියන් වහන්සේගේ හඬට අවනතවී ඇදහිල්ල තුළ ජීවත්වූ ජනතාවගේ අත්දැකීම්ය. පරිහානියට පත්වෙමින් මරණයට ඉරණම් වූ මිනිසා දෙවියන්වහන්සේ හා සම්බන්ධවීමෙන් විමුක්ති සුවය සහ අමරණීයත්වය ලබා ගන්නා මාර්ගය ශු. බයිබලය උද්දීපනය කරයි. මේ ශු. ග්‍රන්ථයේ පණිවුඩයට අවදි වෙමින් එය අයිති කරගැනීමේ මූලික පදනම ඇදහිල්ලයි. දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල නොමැති කෙනකුට ශු. බයිබලය වනාහි විවිධ ජනයාගේ ඉතිහාසගත තොරතුරු, කිතුනු දහමේ දැනුම ලබාගත හැකි හොඳට හෝ නොහොඳට ලියවුණු ග්‍රන්ථයක් විය හැකිය. අනවබෝධය හා මිථ්‍යා ඇදහිලි නිසාද තමන් දෙවියන්වහන්සේ තුළ තැබූ ඇදහිල්ල ක්‍රමක්‍රමයෙන් අහිමි කරගත් අය අපට ඕනෑ තරම් හමුවේ. ඇත්තෙන්ම ඔවුන් මායාවකට හසුවී මිථ්‍යාවක් තුළ අන්ත අසරණ ජීවිත ගතකරන බව ඔවුන් වටහා නොගැනීම ඛේදාන්තයකි. දිනක් මා තරුණ තරුණියන්ව, එක්තරා ධර්ම විවේකයකදී අමතන විට අතරමගදී ප්‍රශ්න ඇසුවේ තුණ්ඩුවල ලියා එවීමෙනි. එක තුණ්ඩුවක මෙලෙස ලියැවී තිබිණි.

"මගේ දෙමව්පියෝ කේන්දර බොහෝ විශ්වාස කරන්නෝ වෙති. ඔවුන් මාගේ කේන්දරයද බලා ඇත. එය අතිශයින් කටුක දේවලින් පිරී ඇත. මගේ උපන් මොහොතේ සිට මරණය තෙක් ජීවිතය එහි ලියැවී ඇත. මගේ ජීවිතය මටම එපා වී ඇත. මගේ මරණ දිනය මම දනිමි. මා කුමක් කළ යුතුද ?"

මේ ප්‍රශ්නය ඇසූ දියණියගේ හෝ පුතණුවන්ගේ ජීවිතයට ඇතිකර ඇති හානිය ඉතා භයානකය. වේදනාත්මකය. මරණ දිනය දැන ගැනීම නිසාම සියල්ලම ඔහුට හෝ ඇයට එපා වී ඇත. එබැවින් බොහෝ ශාස්ත්‍රකාරයෝ, නැකැත් බලන්නෝ, ශුභ අශුභ කියන්නෝ, පේන කියන්නෝ ජනතාව රවටා, මුදල් කොල්ලකමින්, පීඩිත මිනිසුන්ව තව තවත් පීඩනයට ඇද දමමින් ජාවාරම් කරුවෝ වී ඇත (යෙසායා 47:14-14 පරිශීලනය කරන්න). කතෝලික බැතිමතුන් වශයෙන් ඔබ මෙතරම් මුළා වී විනාශයට ගොදුරු වන්නේ ඇදහිල්ල, ශ්‍රද්ධාව නැති හෝ එය හීන වී ඇති නිසා නොවේද? එබැවින් අප අපව අවංක තත්ත්ව පරීක්ෂණයකට ලක් කළ යුතු නොවේද?

**සංස්කාරක පියතුමා**

# වසර 125 සපුරන

## භක්ති ප්‍රබෝධනයේ පූජ්‍ය මෙහෙවර

පුරාතන ශ්‍රී ලංකාවේ සිංහල කියවීම හා ලිවීම රටේ ජනගහනයෙන් සුළුතරයකට සීමා වී පැවතිණි. ඒ සුළුතරයට සිංහල ගුරුවරුන්, නොතාරිස්වරුන්, වෛද්‍යවරුන් හා දෛවඥයන් වැනි පිරිසක් ඇතුළත් වූහ. අද පවත්නා යුරෝපීය භාෂාවලට වඩා ඉපැරණි ඉතිහාසයක් සිංහල හා දෙමළ භාෂාවලට ඇතත් සිංහල හා දෙමළ සාහිත්‍යය බොහෝ දුරට පැවත ආවේ මුඛ පරම්පරාගතවය. ලිඛිතව පැවතියේ වැඩි වශයෙන් පුස්කොළ පොත් හා සෙල් ලිපිය. එහෙත් මුද්‍රණ ශිල්පය ආරම්භ වී ඒ හා සමග මෙරට ද පොත පත බිහි වීම ශාස්ත්‍රාලෝකයට, සාහිත්‍ය වර්ධනයට මෙන්ම ආගමික කටයුතු වලටද සාධනීය බලපෑමක් ඇති කළේය. 1734 දී ජේකබ් ක්‍රිස්ටියන් පිලට් නම් වූ ලන්දේසි ආණ්ඩුකාර තැන මෙරට මුද්‍රණාලයක් පිහිටුවීමට කටයුතු කිරීම වැදගත් සන්ධිස්ථානයකි. 1737 දී ලන්දේසින්ගේ යාච්ඤා පොත බිහිවීම මෙරට කතෝලික නොවුවද ක්‍රිස්තියානි පොත පත මෙරට මුලින්ම බිහි වූ බවට සාධකයකි.

1860 ජූනි මස ආරම්භ වූ බුලත්ගම සිරිධම්මාලංකාර සුමනතිස්ස හිමි කර්තෘත්වය දැරූ "ලංකා ලෝකය" මෙරට නිකුත් වූ ප්‍රථම සිංහල පුවත්පත වුවද මෙරට සිංහල සඟරාවලට ඇත්තේ ඊටත් පැරණි ඉතිහාසයකි. 1832 නිකුත් වූ "මාසික තෑග්ග" මෙරට පළමු සිංහල සඟරාව ලෙස සැලකේ. එහි ප්‍රධාන වශයෙන් බයිබල් කතා ඇතුළත් විය. කතෝලික සභාවේ අභිවෘද්ධිය උදෙසා 1863 දී කොළඹ පිටකොටුවේ අච්චු යන්ත්‍ර ස්ථානයෙහි " අරුණෝදය" නමින් පුවත්පතක් ආරම්භ කෙරිණි. අරුණෝදය අඛණ්ඩව පවත්වාගෙන යා නොහැකි විය. භක්ති ප්‍රබෝධනය 1899 ජනවාරි මස එළිදකින්නේ මෙවන් පසුබිමක් තුළය.

1899 ජනවාරි මස මග්ගොන එම්. මර්සලින් ප්‍රදිනන්දස් හා සී. ඩී. අන්තෝනියස් ජයවර්ධන නම් වූ ගිහියන් දෙදෙනාගේ කර්තෘත්වයෙන් භක්ති ප්‍රබෝධනය එළි දුටුවේය. මෙය මි.මී. 210 -145 ප්‍රමාණයේ පිටු 8 කින් යුක්ත සත 10ක මිලට නියම කරන ලද කතෝලික සඟරාවක් විය. මර්සලින් ප්‍රදිනන්දස්ගෙන් පසුව මේ සඟරාව මග්ගොන නිර්මල මරිය නිකායේ භාරකාරත්වයට පත්වී වී අද දක්වා අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. එය 2024 ජනවාරි මස 125 වසර සමරයි. කිතුනු විශ්වාසයේ හරයන් ප්‍රකාශ කිරීම, පවුලේ සඟරාවක් ලෙස කිතුනු ජනතාව දැහැමි මං ගැන්වීම දෙස බස රැස පෝෂණය කිරීම මිථ්‍යා දෘෂ්ටික හා සභා භේද මත වලට පිළිතුරු දීම කතෝලික අවශ්‍යතා අනුව දහම් පණිවුඩ රැගෙන යාම මේ සඟරාවේ අරමුණ බව මංගල කලාපයේම දක්වා තිබේ. මංගල කලාපය "ඥානාර්ථ ප්‍රදීපය" සමග බෙදා හැර තිබුණේ සඟරාව හඳුන්වා දීමේ අරමුණ ඇතිවය.

1899 ජනවාරි 28 දා නිකුත් වූ "ලක්මිණි පහන" පුවත් පත භක්ති ප්‍රබෝධනයේ භාෂා ශෛලිය අගය කර තිබේ. සඟරාවේ පළ වන වටිනා වැදගත් ලිපි ගැන 1903 අගෝස්තු මස "ඥානාලෝකය" සඟරාව ප්‍රශංසා මුඛයෙන් කතා කර තිබේ. 1908 සැප්තැම්බර් මස "සිළුමිණ" සඟරාව ප්‍රකාශ කරන්නේ මුදල් අගහිඟකම් නිසා කිතුනුවන්ගේ ආදරයට පාත්‍ර වූ මේ සඟරාව ඇණ හිටින්නට ඉඩ නොහැරිය යුතු බවය. 1912 දෙසැම්බර් "සිංහල මිත්‍රයා" ප්‍රකාශ කරන්නේ ප්‍රබෝධනය දියුණු තත්ත්වයකට පත්ව තිබෙන බවය. 1919 මැයි "සිරිසර" 1922 "සත් බස" හා 1925 ජූනි ශ්‍රී සුමංගල සඟරාවද ප්‍රබෝධනය පසසා තිබේ. මෙයින් පැහැදිලි වන්නේ එදා ප්‍රබෝධනය ගමන් මග සමකාලීන පුවත්පත් සගරාවලද පැසසුමට ලක් වූ අයුරුය. 1960 දශකයේදී කෙටි කාලයක් 'පහන් තරුව' යන නමින් ප්‍රකාශයට පත් කෙරුණද නැවතත් භක්ති ප්‍රබෝධනය නමින් මේ දක්වා මේ සඟරාව නිකුත් කෙරේ. වෙසෙසින් ආගම්වාද ඇති යුගවල පවා ප්‍රබෝධනය තම වගකීම් තේරුම් ගනිමින් ගැටුම්වලට නොගොස් පාඨක ජනතාවද රැක ගනිමින් කටයුතු කළ ආකාරය ප්‍රශංසනීයයි. ප්‍රබෝධනය නිසා ලේඛක කලාවට අත්පොත් තැබුවෝද විශාල පිරිසකි. ආගමික තේමාවල ලිපි මෙන්ම කවි කෙටිකතා විශේෂාංග සඳහා ප්‍රබෝධනයේ එදත් අදත් ඉඩකඩ වෙන්විය. එසේම පාසල් දරුවන් අමතක නොකරන ප්‍රබෝධනය දහම් විභාග අත්වැල සැපයීමට ද

9 වන පිටුවට.....

කලා භූෂණ
කැලිස්ටස් ජයමාන්න

භක්ති ප්‍රබෝධනය

# ශ්‍රී ලංකාවේ ඉපැරණිම සිංහල කතෝලික සඟරාව වන "භක්ති ප්‍රබෝධනය" සඟරාවට ලබන වසරට අවුරුදු 125 යි. . . !

දිවයින පුරා විසිරී සිටින ළමා, වැඩිහිටි සියලුදෙනා සඳහා මේ ජුබිලි වසර නිමිත්තෙන්
රචනා, කෙටිකතා, කාව්‍ය සහ චිත්‍ර යන අංශ ඔස්සේ
තරග ගණනාවක් පවත්වන්නට 'භක්ති ප්‍රබෝධනය' සූදානමින් ඇතිබව
ඉතාමත් සතුටින් පාඨක ඔබට දන්වා සිටිමු.

| තරගය | වයස් කාණ්ඩය | මාතෘකා | තරග කොන්දේසි |
|---|---|---|---|
| රචනා තරගය | 6 වසර - 8 වසර (වචන 300 යි) | 1. සුවපත් සමාජයක් උදෙසා පරිසරය සුරකිමු.<br>2. ගුරු-දෙගුරුන් හට ගරු කරමු. සංවේදී වෙමු.<br>3. තාක්ෂණය සහ පාසල් දරුවා. | ■ ඔබ ලියන රචනාව ඔබේම නිර්මාණයක් බව සහතික කරමින් පංතිභාර ගුරුතුමිය හෝ ගුරුතුමා සහ දෙමව්පියන්ගේ ලිපි දෙකක් ඉදිරිපත් කළ යුතුය. |
| | 9 වසර - 11 වසර (වචන 400 යි) | 1. කිතුනු සාරධර්ම ගොඩනගන්නට නවීන තාක්ෂණයේ කාර්යභාරය.<br>2. යෞවනය නැගිටින්න මා ඔබ පසු පස.<br>3. සිංහල කිතුනු බැති ගී සහ ගරු මර්සලින් ජයකොඩි නි. ම. නි. පියතුමා. | ■ රචනාව ෆුල්ස්කැප් කොළවල පමණක් ලියා එවීමට සැලකිලිමත් වන්න. |
| | 12 වසර, 13 වසර (වචන 500 යි) | 1. විභාග ඉක්මවා ජීවිතය හා බද්ධ විය යුතු දහම් පාසල් අධ්‍යාපනය.<br>2. ආධ්‍යාත්මික වර්ධනයෙන් තොර අධ්‍යාපනයේ දිශානතිය කොයිබටද?<br>3. නව යොවුන්විය මුහුණදෙන අභියෝග ජයගනිමු. | ■ රචනය, තරගයට ඉදිරිපත් වන්නාගේ අත්අකුරින් පමණක් ලිවිය යුතු බව සලකන්න. |
| චිත්‍ර තරගය | 1 වසර - 5 වසර | 1. සොබාදහම තුළ දෙවිඳුන් දකිමු.<br>2. අම්මේ තාත්තේ, නැන්දේ මාමේ අපේ රට විකුණන්න එපා.<br>3. පුංචි අපේ සුන්දර ළමා විය විනාශ නොකරන්න. | ■ සුදු පැහැති A4 ප්‍රමාණයේ කඩදාසියක නිර්මාණය කළ යුතුය. |
| කෙටි කතා තරගය | විවෘත | අද පවතින සමාජ පරිහානිය පාදක කොටගෙන සමාජයට වැදගත් පණිවුඩයක් දෙමින් තමන් කැමති මාතෘකාවක් භාවිත කළ හැකිය. | ■ මේ තරගයට ඕනෑම කෙනකුට සහභාගි විය හැකිය. |
| කාව්‍ය (සඳැස් සහ නිසඳැස්) තරගය | | | ■ ඔබගේ නිර්මාණය ස්වතන්ත්‍ර නිර්මාණයක් නොවන බව තහවුරු වුවහොත් ඒ නිර්මාණයේ ජයග්‍රහණය සහ ත්‍යාගය අවලංගු වන බව කරුණාවෙන් සලකන්න. |

**ජයග්‍රාහකයන්ගේ ත්‍යාග :**

ඉහත සඳහන් සියලු තරගවල පළමු, දෙවන සහ තෙවන ජයග්‍රාහකයන් හට පිළිවෙළින් රු. 20 000, රු. 15 000 සහ රු. 10 000 ක් වටිනා මුදල් ත්‍යාග සහ භක්ති ප්‍රබෝධන සහතික පතක් හිමිවන අතර සියලු තරගවල පළමු, දෙවන සහ තෙවන ජයග්‍රාහකයන් ඇතුළුව පළමු ජයග්‍රාහකයන් දස දෙනාට තිළිණයක් ද හිමි වේ.

සෑම තරගයකින්ම පළමු ස්ථානය හිමිකරගන්නා ජයග්‍රාහකයන්ගේ නිර්මාණ වසර 125 සපිරෙන භක්ති ප්‍රබෝධන සමරු කලාපයේ පළ කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

සැ. යු. :

- සියලු තරගකරුවන් තම නිර්මාණ 2024 ජනවාරි 31 දිනට පෙර භක්ති ප්‍රබෝධන කාර්යාලයට තැපෑලෙන් හෝ ගෙනැවිත් බාර දීමට කාරුණික වන්න.
- මේ නිර්මාණ අධ්‍යයනය කරන විනිසුරු මඩුල්ලට තරගකරුවන්ගේ නම සඳහන් නොකර අංකයක් පමණක් සඳහන් කර එය යොමු කිරීමට අප තීරණය කර ඇති බැවින් නිර්මාණය ඇති පත්‍රිකාවේ පසුපස හෝ වෙනත් තැනක තරගකරුවාගේ හෝ තරගකාරියගේ නම සඳහන් නොකර වෙනම පත්‍රයක නම, ඉගෙනුම ලබන වසර/ පාසැල සහ පාසල පිහිටි ගම (තවම ඉගෙනුම ලබන්නේ නම්), වයස, පදිංචි ස්ථානයේ ලිපිනය සඳහන් කර නිර්මාණය සමග අප වෙත එවන්න.
- විනිසුරු මඩුල්ලේ තීරණය අවසාන තීරණය වන බව සියලු තරගකරුවන් කරුණාවෙන් සලකන්න.

**සංස්කාරක පියතුමා**
**'භක්ති ප්‍රබෝධනය - නිර්මාණ තරගය - 2024'**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

කා
ච
සි
ත

## අළුත් නෑ අවුරුද්ද

ලංකාවෙ නැවතිච්ච
තවත් ජීවිත ඇත්ද
දරුවො නම් පව් තමයි
අපි අතර ඉපදිච්ච

කරන්ට් බිල වැඩි උනා
ඉර ඉතිං අඩු වෙන්න
ගිනි වතුර ටැප් එකේ
සඳේ සිසිලස දෙන්න

ඉර ටිකක් ඉන්නවද
හෙටක් නෑ දැන් අපිට
කැලන්ඩර් ඕනෙ නෑ
නැවතිච්ච හුස්මකට

**චමත් බී. පයාගල**

# ඇදහිල්ල අන්ධ නොවේ ද?

ඇදහිල්ල යනු බුද්ධි විරෝධී දෙයක් හෝ අතාර්කික දෙයක් හෝ අන්ධ දෙයක් හෝ නොවේ. ඇදහිල්ල යනු බුද්ධිමත් භාවයේ අග්‍ර ඵලයයි. ඊට හේතුව, ඇදහිල්ලේ දී අප දෙවියන් වහන්සේගේ දෘෂ්ටිකෝණයෙන් ලෝකය දෙස බැලීමට හා අප දෙස බැලීමට උත්සාහ දැරීමයි. එවිට අපි අපගේ පටු දෘෂ්ටිකෝණවලින් ඔබ්බට යන්නෙමු, අපගේ බුද්ධිය කොතරම් සීමිත ද යන්න හඳුනා ගන්නෙමු. ඇදහිල්ල ඇති තැනැත්තා බුද්ධිමය ලෙස ඉතා විවෘත පුද්ගලයෙකි. එමෙන්ම ඒ විවෘතභාවය තම මරණ මොහොත දක්වා ම නඩත්තු කිරීමට ද ඒ පුද්ගලයා උත්සාහ දරයි.

බුද්ධිමය ලෙස පටු පුද්ගලයා ඇදහිල්ල හිඟ පුද්ගලයෙකි, ඇදහිල්ල නැති කරගත් පුද්ගලයෙකි. එවැන්නකුට ජීවිතයේ සැබෑ අර්ථය, ගැඹුරු අර්ථය තේරුම් ගත නොහැකිය. අපගේ බුද්ධිය ආලෝකවත් කරන්නේ ඇදහිල්ලයි. ඇදහිල්ල අන්ධ දෙයක් නොවන්නේ ඒ නිසයි. යම් පුද්ගලයෙක් අන්ධකාරයේ ජීවත් වන්නේ නම්, ඒ තැනැත්තා ඇදහිල්ල අහිමි කර ගත් පුද්ගලයෙකි. ඇදහිල්ල අන්ධ දෙයක් යැයි පවසන්නේ ඇදහිල්ල පිළිබඳ අව්‍යාජ අත්දැකීමක් හා අවබෝධයක් නැති තැනැත්තා ය. ඇදහිල්ල යනු මනඃකල්පිත හෝ මනෝමූලික හෝ දෙයක් ද නොවේ. එය හුදු සිතිවිල්ලක් හෝ හැඟීමක් ද නොවේ. එය ආධ්‍යාත්මික බලයකි, ශක්තියකි. අපි නීරෝග ආහාර අනුභව කිරීමෙන් හා ක්‍රීඩා කිරීමෙන් ශරීර ශක්තිය වැඩි කර ගත් විට, අපට එය දැනෙනවා සේ, ඇදහිල්ලෙන් ලැබෙන ආධ්‍යාත්මික හා චෛතසික ශක්තිය ද අපට දැනෙයි. එවිට අනාගතය ගැන ඇති බිය පහවී යයි, අභියෝග හමුවේ කලබල වීම නැති වී යයි, තමන්ට කිරීමට බැරි යැයි පෙර සිතූ දේවල් සාර්ථකව කිරීමට පටන් ගනියි. තමන් ඉතා ධෛර්යවන්ත, වීරවන්ත, අධිෂ්ඨානශීලී පුද්ගලයකු බවට පත් වේ. තමා නව මිනිසෙක් බවට පත් වේ. එය එසේ වීමට හේතුව කුමක්ද?

දෙවියන් වහන්සේ කෙරෙහි අදහන ප්‍රමාණය වැඩි වන තරමට, අපගේ ආත්ම ශක්තිය ද වැඩි වේ. ආත්ම ශක්තිය වැඩි කරනු ලබන්නේ උන්වහන්සේ විසින් ය. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය වැඩි වන තරමට, උන්වහන්සේට ළං වන ප්‍රමාණය ද වැඩි වේ. එවිට උන්වහන්සේ අපව, අප සිටින තැනින් උසස් තැනකට ඔසවයි. එවිට නිරායාසයෙන්ම අපගේ ආත්ම ශක්තිය (Self-confidence) ප්‍රබල වීමට පටන් ගනියි. අපි දෙවියන් වහන්සේ ගැන විශ්වාස කරන ප්‍රමාණය වැඩි වන තරමට, අපි අප ගැන විශ්වාස කරන ප්‍රමාණය ද වැඩි වේ. එමෙන්ම අප දෙවියන් වහන්සේ ගැන විශ්වාස කරන ප්‍රමාණය අඩුවන තරමට, අපි අප ගැන විශ්වාස කරන ප්‍රමාණය ද අඩු වේ. ඇදහිල්ල අඩු අයගේ ආත්ම ශක්තිය ඉතා දුර්වල වන්නේ ඒ නිසාය. ඔවුන් විවිධ බලවේග පසුපස හඹාගොස් ජීවිතය අවුල් කර ගන්නේ, නාස්ති කර ගන්නේ ඒ නිසාය. ආත්ම ශක්තිය නැති වූ කෙනා ඕනෑම දෙයකට රැවටෙන ප්‍රමාණය ද අධිකය. හීනමානය ද පැමිණෙන්නේ ඇදහිල්ල දුර්වල වූ විට ය. එමෙන්ම ඔවුන්ව රැවටීම ද ඉතා පහසුවෙන් කළ හැකිය. දෙවියන් වහන්සේ තුළ ශක්තිමත්ව සිටින කෙනා කිසිම බලවේගයකට නොරැවටේ. ඔවුන්ගේ ජීවිත ද අර්ථවත් ජීවිත බවට පත් වේ. ඇදහිල්ල ශක්තිමත් කෙනාගේ ප්‍රේම කිරීමේ හැකියාව ද ඉතා ප්‍රබලය. යම් පුද්ගලයකු කෙරෙහි අපගේ විශ්වාසය කඩ වුවහොත්, ඒ පුද්ගලයාට ප්‍රේම කිරීම ඉතා දුෂ්කර කාර්යයක් බවට අපි අත්දැකීමෙන් දනිමු. එසේ නම් ඇදහිල්ල දුර්වල වූ විට, ප්‍රේම කිරීමේ හැකියාව ද දුර්වල වේ. එවිට අපි හුදකලා පුද්ගලයන් බවට පත් වන්නෙමු. අපට සමීපව සිටි අය ද අපගෙන් ඈත් වීමට පටන් ගනිති.

ඇදහිල්ල යනු එක තැන පල් වෙන දෙයක් නොවේ. අප වයසින් මුහුකුරා යන ප්‍රමාණය වැඩි වන තරමට, ඇදහිල්ලෙන් වර්ධනය විය යුතු ප්‍රමාණය ද වැඩි විය යුතු වේ. ඇදහිල්ල වැඩි වෙන විට, ජීවිතයේ කරදර හා බාධක ගැන අනවශ්‍ය ලෙස මැසිවිලි නඟන ප්‍රමාණය ද අඩු වේ. ජීවිතයේ සැබෑ සැනසීම ලැබෙන්නේ දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ලෙනි. මිල මුදල්, වතුපිටි, යාන වාහන, රැකී රක්ෂා, තනතුරු, නිලතල, තාන්න මාන්න යනාදියෙන් ලැබෙන සුරක්ෂිතභාවය හා සතුට තාවකාලික ය. ඒවා අද තිබී හෙට නැති වන දේවල් ය. අපට සදාකාලික සැනසීම හා සතුට ලැබෙන්නේ දෙවියන් වහන්සේගෙන් පමණක් ය. අප වාසය කරන ලෝකයේ තත්ත්වය කෙතරම් දරුණු වුවත්, පාපකාරී වුවත්, අපගේ හදවතට සැබෑ සුරක්ෂිතභාවයක් පැමිණෙන්නේ ඇදහිල්ලේ ගමනකට අප කැප වූ විට ය. මේ ලෝකය කොතරම් හිංසාකාරී වුවත්, ඒ තුළ තවමත් යහපත් පුද්ගලයෝ සුළු ප්‍රමාණයක් හෝ සිටිති. එනිසා ලෝකයේ පවතින අන්ධකාරය දෙස බලා බලාපොරොත්තු සුන් කර ගැනීමට හේතුවක් නැත. අඳුරින් පිරුණු ලෝකයක සුළු ප්‍රමාණයෙන් හෝ

පවතින යහපත හඳුනා ගැනීමට හා එය වැඩි දියුණු කිරීමට ගැඹුරු ඇදහිල්ලක් අවශ්‍ය ය. ඇදහිල්ලේ දෘෂ්ටිකෝණය නැති පුද්ගලයා සර්ව අශුභවාදියෙක් බවට පත් වේ. ජීවිතය දෙස ශුභවාදීව බැලීමට නොහැකි වීම ඇදහිල්ල මදිකමේ ප්‍රතිඵලයකි. සමහර පුද්ගලයන් සිය දිවි නසා ගැනීමට ද උත්සාහ දරන්නේ මේ හේතුව නිසාය. ඇදහිල්ල අඩු වූ විට ජීවත් වීමට ඇති උද්‍යෝගය ද අඩු වේ. දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල වැඩි වූ විට, ජීවිතයට ආදරය කරන ප්‍රමාණය ද වැඩි වේ. එවැන්නෙක් කිසිම හේතුවක් නිසා හෝ අර්බුදයක් නිසා හෝ තම ජීවිතය නැති කර ගැනීමට නොසිතයි. එපමණක් නොව එවැනි අය අන්‍යයන්ට ද ආශීර්වාදයක් හා ආදර්ශයක් බවට පත් වෙති.

ඇදහිල්ල ශක්තිමත් මිනිසුන් සිටින සමාජයක් යහපත් සමාජයකි, දැහැමි සමාජයකි. ඇදහිල්ල පවතින සමාජයක් මිනිසුන්ගේ ජීවිතවලට පැහැදිලි පරමාර්ථයක් දෙන සමාජයකි. අර්ථවත් ජීවිතයක් ගත කිරීමට, ජීවිතයට පැහැදිලි ඉලක්කයක් හා දිශානතියක් තිබිය යුතු වේ. ජීවිතයේ ප්‍රබලතම පරමාර්ථය වන්නේ දෙවියන් වහන්සේ උදෙසා ජීවත් වීමයි. එවැන්නෙක් කිසිම හේතුවක් නිසා මානසික ලෙස කඩා වැටීමකට ලක් නොවේ, විශාදයට ලක් නොවේ, ඇතුළත හිස් භාවයකට ලක් නොවේ. එවැනි ජන සමාජයක වසන තරුණ පරපුරට ද ජීවිතය ගැන පැහැදිලි පරමාර්ථයක් ලැබේ. ඇදහිල්ල නැති සමාජයක තරුණ පරපුර ද වල්මත් වූ පුද්ගලයන් බවට පත් වෙති. තරුණ පරපුර වෙනුවෙන් අපට කළ හැකි උපරිම සේවය නම්, ඔවුන්ට ඇදහිල්ල දායාද කර දීමයි. ඇදහිල්ල අධ්‍යාපනයටත් වඩා ජීවිතයට වැදගත්ය. උසස් අධ්‍යාපනයක් ලැබීම වැදගත් නොවන බව මෙයින් කිසිසේත්ම අදහස් නොවේ. එහෙත් උගත්කමින් පමණක් විසඳිය නොහැකි දේවල් බොහෝ ඇත. ඒවා විසඳිය හැක්කේ ඇදහිල්ලේ බලයෙන් පමණය. ඇදහිල්ලට ජයගත නොහැකි ජීවිත අර්බුදයක්, ගැටලුවක් හෝ දුෂ්කරතාවක් නැත. ඇදහිල්ලේ දී අප තුළ ක්‍රියාත්මක වන්නේ අපගේ බලයක් නොව දෙවියන් වහන්සේගේ බලයයි. එනිසා උන්වහන්සේගේ බලයට ජය ගත නොහැකි ගැටලුවක් නොමැත. සැබෑ නිර්භීතකම, ධෛර්යය, යහපත, දැහැමිභාවය, ශුද්ධවත්භාවය, නිහතමානකම, ප්‍රඥාව, අධිෂ්ඨානය, සමාව දීමේ හැකියාව, විඳ දරා ගැනීමේ හැකියාව, සංවේදීභාවය, දයා කරුණාව, පරාර්ථකාමීත්වය, අවංකභාවය, ඉවසීම, පරිත්‍යාගශීලීත්වය, බුද්ධිමත්භාවය යනාදී සියලුම වටිනාකම්වල උල්පත දෙවියන් වහන්සේ කෙරෙහි පවතින ඇදහිල්ලයි.

ඇදහිල්ල නොමැති ජීවිතය ඉලක්කයක් නොමැති ජීවිතයකි, පාවෙන ජීවිතයකි. ඇදහිල්ල හිඟ වූ විට එයින් හානියක් වන්නේ දෙවියන් වහන්සේට නොව අපටමය. එනිසා ඇදහිල්ල හීන අය කළ යුත්තේ තම ඇදහිල්ල ශක්තිමත් කර දෙන මෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටීමයි (ලූක් 17: 5). එය ඉල්ලිය යුත්තේ ද ඇදහිල්ලෙන්ය. එවිට සියල්ලන්ට නොමසුරුව, දොස් නොතබා දෙන දෙවියන් වහන්සේ එය අපට ප්‍රදානය කරන සේක. අවසාන විග්‍රහයේ දී ඇදහිල්ල ද දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන තිළිණයකි. උන්වහන්සේගෙන් අපට ලැබෙන අගනාම තිළිණය ද එයයි. අපට ලෞකික ලෙස ලැබී ඇති සෑම දෙයක් ම අවසානයේ දී අපට අහිමි වේ. අපගේ මරණ මොහොතට අප ගෙනියන්නේ උන්වහන්සේ කෙරෙහි පවතින ඇදහිල්ල පමණි. අපගෙන් උදුරාගත, සොරා ගත නොහැක්කේ ඇදහිල්ල පමණි. ඇදහිල්ල ඇති තැනැත්තා සියලු දේම ලබා ගනියි; ඇදහිල්ල නැති තැනැත්තාට සියලු දේම අහිමි වේ. ඇදහිල්ල නැති තැනැත්තා ජීවත් වන්නේ මියගිය කෙනකු ලෙසය. ඇදහිල්ල ඇති තැනැත්තා සදාකාලයටම ජීවත් වේ, සදාකාලයටම සතුටට පත් වේ.

**මහාචාර්ය ඇන්ටන් මීමන**

**වසර 125 සපුරන... 5 වන පිටුවෙන්...**

නිර්ලෝභ වී තිබේ. ළමා නිර්මාණවලට ඉඩ සලසන අතර දැනුම වර්ධනය සඳහා ප්‍රහේලිකා ඉදිරිපත් කරමින් ත්‍යාග ද පිරිනමයි. යොවුන් සඳැල්ල තරුණ වේදිකාවක් බවට පත්ව තිබේ. එසේම කාලීන තේමා ඔස්සේ ජන හදට කතා කිරීම අගය කළ යුතුය. මේ දක්වා ගිහි පැවිදි ලේඛක පිරිසක් ප්‍රබෝධනය හා අත්වැල් බැඳ ගෙන සිටීමට ද වාසනාවකි.

"ලෝ පුරා ගොස් සකල සත්ත්වයන් හට සුබ අස්න දේශනා කරන්න" (මාක් 16:15). සුබ අස්න දේශනා කිරීමට මම බැඳී සිටිමි. සුබ අස්න දේශනා නොකළොත් මම මහා කාලකණ්ණියෙක් වෙමි (1 කොරොන්ති 9-16). පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන්ම මම ද ඔබ යවමි (ජුවාම් 20-19) වැනි බයිබල් පාඨවලින් ප්‍රකාශ වන කිතුනු සන්නිවේදන ක්‍රියාවලිය නිවැරදි වටහා ගැනීම ප්‍රබෝධනයේ සාර්ථක ගමන් මගට හේතු වූවා නිසැකය. ඒ ගමන් මගේ තවදුරටත් නිවැරදිව යන්නට අපිද දේවාශීර්වාදය ප්‍රාර්ථනා කරමු.

# අප බොරු සාක්ෂිකරුවෝද?



අවුරුදු ගණනක් ඉහත ජාතික කණ්ඩායමෙන් ඉවත හළ ඇන්ජලෝ මැතිව්ස්, 2023 ලෝක කුසලානට එක්ව සිටිනු දුටුවෙමි. එකල ඔහුට එල්ල වූ බරපතල චෝදනාවක් වූයේ පිටියේ ක්‍රීඩාකරන විට පිතා පුත්‍රයා දැමීමයි. කලක් පිටියෙන් බැහැරව සිට නැවත පිටියට පිවිසි ඔහු පෙරසේම කුරුස ලකුණ, බලා සිටින බිලියන ගණනක මිනිසුන් අබිමුව සටහන් කළේය. ඔහු මෙන්ම අපත් බහුතර කතෝලිකයනුත් විශේෂයෙන් ලාංකික කතෝලික සම්ප්‍රදාය තුළ කුරුසිය හා පිතා පුත්‍රයා දමනු ලබන්නේ යමක් පටන් ගැන්මේ දී හා අවසානයේ දීය.

සමහරුන් දිය නෑමට පෙරද, බෙහෙත් වරුව බීමට පෙරද එය අනුගමනය කරනු මම දැක ඇත්තෙමි. පරපුරු දෙකකින් එහා, පියතුමකු පාරේ එන විට, මහ හයියෙන් 'ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා' යැයි පැවසූ අප කිතුනුවා ටිකෙන් ටික ජනතාව ඉදිරියේ සාක්ෂි දැරීම, තරමක මදිකමක් සේ සිතීම ද මා හට නිරීක්ෂණය වී ඇත. ඇදැහීම තුළ මෙය සංස්කෘතික ලක්ෂණයකට වඩා, ක්‍රිස්තුන් වහන්සේ තුළ අපගේ මාංසය ආත්මය එක්කිරීමකි.

ක්‍රි. ව. 313 වන තුරු ක්‍රිස්තු සභාව පැවැතියේ රාජ්‍ය බලය හෝ නිල බලය රහිතව වන අතර අධික පීඩන සමයකට ද එය හසුව තිබිණි. ඉතා කුඩා කණ්ඩායමක් වූ ක්‍රිස්තු සංඝය, ශත වර්ෂ 3 ක් තුළ අත්විඳි පීඩනය තුළ පවා ඉදිරියට පැමිණියේ ඉතාමත් ස්ථිර විශ්වාසයක් හා ඉතා ගැඹුරු සාක්ෂි දැරීමකිනි. යුරෝපා ශිෂ්ටාචාරය ඉතාමත් ඉහළ තැනකට පසුව ගෙන ආවේද, ක්‍රිස්තු ආභාසය තුළ වෙයි. කෙසේ වෙතත් අද වන විට ක්‍රිස්තු සභාව බිලියන 1.2 කට අධිකව පැතිරී තිබුණත් සමහර රටවල අදටත් මේ පූර්ව ක්‍රිස්තු යුගයේ සංඝ මෙන් කිතු දහමට එරෙහිව ඉතා දැඩි පීඩන සමයක් ක්‍රියාත්මක කරයි.

බහුතර උතුරු අප්‍රිකානු රටවල්, මැද පෙරදිග හා ආසියානු කලාපයේ පාකිස්තානය, බංගලාදේශය හා ඉන්දියාව තුළ ක්‍රිස්තු භක්තිකයන් ඝාතනය කිරීම්, දූෂණ සහ මංකොල්ලකෑම්, නිසි තැන නොදී කොන්කිරීම් අදට ද සිදුවෙයි. ඒ ඔවුන්ගේ සාක්ෂි දැරීම නිමා කිරීමේ අදිටනින් හෝ පීඩනය මෙහෙයවන්නන්ගේ දර්ශනය පමණක් ලොව තිබිය යුතුය යන අර්ථය පෙරදැරි කරගෙන වෙයි.

ජේසුස් වහන්සේ පවසන පරිදි, ඔබ මා සඳහා මිනිසුන් ඉදිරියේ සාක්ෂි දෙතිද? මමත් මහෝත්තම දෙවිඳුන් ඉදිරියේ ඔබ වෙනුවෙන් පෙනී සිටිමි. මෙය උන්වහන්සේගේ පොරොන්දුවකි.

මෙය සරලව, ඔබ ඔබේ යහළුවකු යැයි සිතන කෙනකු, එය සත්‍යදැයි වටහා ගැනීමට නම්, ඔහු ඔබ නැති තැන ඔබ වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටීම සැලකිය හැකිය. මෙය ඉතා සරලව පක්ෂ ලෙස බෙදී සිටින හා සමාජයේ පක්ෂ විපක්ෂව ඉන්නා නායකයන්ට අදාළ නොවේ. ආණ්ඩුව ඉන්නා නායකයන්ට අදාළ නොවේ. ආණ්ඩුව වෙනස් වුණත් ප්‍රධානීන් අප සමඟ ඔවුනට ගැරහුවත් ඔවුන් එකිනෙකාට එකඟය. ඒ හොරකමට හෝ මංකොල්ලයට ජාති, කුලය හෝ ආගම නැති අතර කුණු රසට හුරු වූ කබරයන් මෙන් ඒවා භුක්ති විඳිති.

මා පෞද්ගලිකවම ශල්‍ය වෛද්‍යවරයකු

ලෙස එක්තරා පැවිදි සොහොයුරියකුගේ තුවාලයක් බැලීමට ගිය විට දුටු මතින් වැටහී ගියේ එය ඉතා නරක අතට හැරී තිබූ තුවාලයක් බවයි. එතුමියගේ ජීවිතය රැක ගැනීමට නම් අදාළ කකුල තැනීම වෙනුවට එය කැපිය යුතුව තිබුණි. නමුත් ඉතා සුළු ප්‍රතිශතයක්. එනම් සියයට 0.01 පමණ එය හොඳවීමට ඉඩ ඇති බව මට මගේ දැනුමට අනුව වැටහිණි. මා පාදය පිළිසකර කිරීමට පෙර ඇයගෙන් විමසා සිටියේ මෙය මාගේ අවසාන උත්සාහය බවයි. ඒ ගැන ඇය සිතන්නේ කුමක්ද කියා ඇසීමටත් අමතක නොකළෙමි. ඇය ඊට ලබාදුන්නේ ඉතා නිර්භීත ධනාත්මක පිළිතුරකි.

"ඩොක්ටර් ජේසු මා එක්ක නම් මම මොකටද බය වෙන්නෙ? ඩොක්ටර් ඔබට පුළුවන් දේ කරන්න. නමුත් මම දන්නවා ජේසු මගේ කකුල ආපහු මට දෙනවැයි කියලා". ඇගේ බස මාවද අන්ද මන්ද කළේය.

"මම ආයෙත් ඇවිදිනවා ඩොක්ටර්. අනිවාර්යෙන්ම ඇවිදිනවා".

එතුමිය එසේ ඇගේ විශ්වාසය සපථ කළ අතර මම ශල්‍යකර්මය ආරම්භ කිරීමට පෙර පිතා පුත්‍රයා දැමීමට අමතක නොකළෙමි. ඇයද එසේ කළාය. එසේම ඇය මගේ නළල මත කුරුසියේ ලකුණු සලකුණු කළාය. දින පහකට පසුව ශල්‍යකර්මය සාර්ථක බවට නිමිති පළවූ අතර එය අදින් වසර අටකට පෙර මා සේවය කළ රෝහලක දී අද්දුටු අත්දැකීමකි. ඒ වන විට ඇයගේ වයස අවුරුදු 79 කි. අදටත් ඇය කන්‍යාරාමයේ ගෙවතු වගාවට සක්‍රියව සම්බන්ධවනුයේ 87 වන වියේ පසුවෙමිනි. ඇයගේ පූර්ණ අවසරය මත මෙය පළකරනු ලබන අතර ඇය සුරදූතික නිකායට අයත් විශ්‍රාමික විදුහල්පතිනියකි.

අපගේ විශ්වාසය අප තුළ තිබිය යුතු අතර, සාක්ෂි දැරීම තුළ ක්‍රිස්තුස් වහන්සේට අන් අය ඉදිරියේ ප්‍රකාශ කරමු. එය අපේ ක්‍රමයයි.

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී
උ. කො. ශික්ෂණ රෝහල - රාගම

## ආගම උපකරණයකි

පිහිය කුස්සියට නැතිවම බැරිය.
පිහියෙන් මිනී මරන්නත් හැකිය.

කීර්තිකාමී, ධනකාමී, බලකාමී
පටු අරමුණු පිණිසත්,
ආත්ම වංචාවේ ආස්වාදය පිණිසත්,
ආගම යොදාගත හැකිය.
එමෙන් ම
ආධ්‍යාත්මික සුවය පිණිසත්
ආගම යොදාගත හැකි ය.

ජනතාව රැවටීම සඳහා
ආගම දඬමීමා කර ගන්නට
පාලකයන්ට හැකිය.
එමෙන්ම,
පාලකයන්ව හික්මවීම පිණිසත්
සිවිල් බලයක් ආගමට ඇත.

පරිසිවරු ආගම් අපයෝජනය කරති.
දිවැසිවරු ආගම් තුළ
ධර්මය ඉස්මතු කිරීමට පූජා වෙති.
පරිසිවරයෙක් ද, දිවැසිවරයෙක් ද,
රොබෝවරයෙක් ද, හැම කෙනකු තුළම
විවිධ මට්ටමෙන් වෙසෙති.

ආගම් යනු උපකරණ මිස
ධර්මය හෝ දෙවියන් නොවේ.
විවිධ දෙවිවරුන් යනු විවිධ පුද්ගලයන් වුවත්
සැබෑ වූ එකම දෙවියන් යනු ධර්මයම වේ.
ධර්මයම ධර්මයාණෝය.
ආගමකට ගැති වීම සහ
ආගම් විරෝධී වීම යන දෙකම
අධාර්මිකය.

සමස්ත සොබාදහම
මම නමැති විඳින්නා සහ
උතුම් බෝසත් ගුණය (ශ්‍රද්ධාත්මය) යන
ත්‍රිත්වය අතර ඇත්තේ
අවියෝජනීය සම්බන්ධයකි.

**සපුගස්කන්දේ රංජිත්**

# ඇදහිමට අභියෝග ඇත. මෝඩකමට බෙහෙත් නැත.

එකම දෙය වරක් හෝ දෙවරක් කිරීමෙන් එය පුරුද්දක් බවට පත්වේ. පසුව පුරුද්ද සිරිතක් බවට පත්වේ. සිරිත සම්ප්‍රදායක් බවට පත්වේ. ඇතැම් විට වචන පැටලීමක් හෝ කථාවක දී සිදුවීම, ඉහළ මට්ටමේ කෙනකුගෙන් සිදුවූයේ නම් එය වැරදීමක් නොවේ. හිතාමතා කළ දෙයකි. හිතාමතා කළ දේ මෙන් ම අත් වැරදීමකින් ද සිදු වූ දෙයට ඇතැම්විට අපට පුරුද්දක් වේ. එය ආයාසයෙන් සිදු වන්නකි. චාරිත්‍රය ද නොදැන සිටීම විහිළුවට කරුණකි.

මා මෙහිදී සඳහන් කරන්නේ ඉතාම සැහැල්ලු සිනහ පළවන සිද්ධියකි. පාසල් යන අවධියේ මා දේව සේවයට ලැදියාවක් ඇති බව දැනගත් මගේ මිතුරකු ශ්‍රේෂ්ඨ පියතුමා සමඟ මා හමුවන්නට නිවසට පැමිණ සිටියත්, මා එවිට නිවසේ සිටියේ නැත. මගේ දෙමාපියන් සුහදව ඔවුනට සංග්‍රහ කරන්නට පියවර අරගෙන තිබුණි. තිබුණු සාම්ප්‍රදායික සිරිත අනුව ඔවුන් වතුර වීදුරුවක් පිළිගන්වමින් ඔවුන්ට ඇරයුම් කර ඇත. වෙනත් ප්‍රදේශයකින් පැමිණි පියතුමා ඒ ප්‍රදේශයේ සිරිත නොදැන එක්වරම වතුර වීදුරුව රැගෙන පානය කළේය. පසුව තරමක් අකමැත්තෙන් මගේ මිතුරා දෙස බලා "ඈ දරුවා ඒ තැඹිලි වතුර එක කිසි රහක් නැහැ. වතුර වගේ නේ..." "පියාණනි ඒ වතුර තමයි. ඒ ඔබතුමාටයි, මටයි ආරාධනා කරන්න ඒ වතුර වීදුරුව ගෙනාවේ..." "ආ ඒකත් එහෙම ද? වෙරි සොරි...." ගෙදර උදවිය සිනහමුසු මුහුණින් මට ඇරයුම් කිරීමට විගස වතුර වීදුරුවක් ගෙනාවේය.

මෙය ද මට පූජක මුල් සමයේ සිදුවූවකි. පියෙක් තමාගේ කුඩා දරුවාගේ පළමු හිසකෙස් කැපීමට මා සොයා ආවේ ය. එදින මීසම් දිනය වූයෙන් විගස ඔහුගෙන් කතුර ඉල්ලා හිසකේ කපන්නට ලැස්ති වුණෙමි. "හා, හා පියාණනි, දකුණ බලන්න". "ඔයාද, දරුවාද, මම ද?" ඔහු තරමක් නිහඬව සිට නැවත මා කතුර ගත් විට පියතුමනි ටිකක් ඉන්න. තව ටිකක් වෙලා තියෙනවා.... වෙලාව 10.22 ... "වැඩ කිහිපයක් තිබුණත් මං ඉවසා සිටියෙමි". "වෙලාව මගේ ඔරලෝසුව අනුව හිසකේ කැපුවෙමි". දැන් හරි ද?" "හරි පියාණනි, ජේසු පිහිටයි..." "දැන් හරි කීව නේද? ඒ වුණාට මගේ ඔරලෝසුව වැරදියි. ඔරලෝසුවේ කටු ටිකක් වේගයෙන් දුවන්නේ".

රසමුසු සිද්ධි බොහෝ ඇතත්, ජනතාව අතර ඇති අප ඇදහිල්ලට අභියෝග කරන සිද්ධි කිහිපයක් සඳහන් කරමි.

- **කපුටෙක් කෑගැසුවිට අමුත්තකු එන බවට මතය**
- **ගමනක් යන්නට පිටත් වන විට බල්ලකු කන ගැසුවොත්, හූනකු ශබ්ද කළහොත්, පොල්කිච්චකු කෑ ගැසුවොත්, බළලකු ඉදිරියට පැන්නොත්, හිස් කළයක් ගෙන එන කෙනකු මුණ ගැසුණොත් ගමන පමා කිරීම.**

මේ සලකුණු විශ්වාස කිරීමෙන් අද ඇදහිල්ලට අභියෝගයක් සිදු වේ. මා පිටරටක දී වාහන පැදවීමට අවසර පත්‍රය ලැබීමට වාහනය පදවද්දී ඉදිරියට බළලකු පැනීම නිසා තිරිංග පෑගුවේ ඌ යට නොවීමට ය. නමුත් පරීක්ෂකයා "පියතුමනි මොකද බ්‍රේක් ගැහුවේ පිටුපසින් තව වාහන එනවා. ඔබට වේගයෙන් යන්නයි තිබුණේ. මං ලකුණු කපනවා කීවේ ය".

එක්තරා ප්‍රදේශයක කෙනකු මිය ගිය අවස්ථාවක දී අමුතු සිරිතක් තිබුණි. මියගිය කෙනා වියපත් කෙනෙකු නම් වේලිච්ච පොල් කොළයක් ද, තරුණ අයකු නම් වියළීමට කිට්ටු අමු පොල් කොළයක් ද, දරුවකුට ළපටි ගොක් කොළයක් ද එල්ලන සිරිතක් තිබුණි. දරුවාගේ වයස අනුව කොළය නැවීමෙන් සෙසු අයට මියගිය අයගේ වයස තීරණය කළ හැකිය. දිනක් ළදරුවකු මළ විට ඒ ළඟින් යන තරුණයෙක් විහිළුවක් කරන්න සිතා වේලිච්ච කොළේ නමා ගියේ ය. සිදුවූ අකරතැබ්බය මං කියන්න ඕනේ නැනේ. දින සිද්ධි සුබ හෝ අසුබ යයි තීරණය කළ යුත්තේ එකිනෙකා ය. "එක කෙනෙක් එක දවසක්, වෙන දවසකට වඩා සුබ යයි සිතයි. වෙන කෙනෙක් සෑම දවසක් ම එක සමාන යයි සිතයි. මෙවැනි කරුණු ගැන එකිනෙකා තම තමාගේ ම සිතට එකඟව තීරණයක් ගත යුතු ය" (රෝම 14:5).

මේ ලිපිය සමාප්ත කරන්නට පෙර මගේ ප්‍රායෝගික අත්දැකීමක් විස්තර කරන්නට අවසර. අලුත විවාහ වූ තරුණයෙක් තමන් ගොඩ නගමින් සිටි අලුත් නිවස ආශීර්වාද කරගන්නට පැමිණියේය. නිවස සාදා නිම කරන්නට පෙර ඔහු නිවසේ වස්දොස් බලා ගන්නට ගියේ ය. වස්දොස් සොයන කෙනා කීවේ ගෙදර මැද බිත්තිය ගෘහ මූලිකයාට අශුභ බවත් නිවසට තරමක් සමීපව තිබෙන පොල් ගස් දෙක කපන ලෙසත් ය. ඔහු මැද බිත්තිය කැඩුවේ ය. එක් පොල් ගසක් කපා ඒ පොල් කඳ උඩට වී කපන අනෙක් පොල් ගස කපනු බලා සිටියේ ය. අනෙක් පොල් ගස කැපූ පොල් ගස උඩට වැටුණෙන් ගෘහ මූලිකයා උඩ විසි වී බිම වැටුණේ ය. ඔහුගේ කකුල කැඩුණේ ය. පොල් ගස් දෙකම කැපුවේ ය. ගෙයි මැද බිත්තිය කැඩුණේ ය. ගෘහ මූලිකයාගේ (ගෘහ මූලිකයකු වෙන්නට ප්‍රථම) කකුල ද කැඩුණේ ය. දිවැසිවරයාගේ කීම ඉටු වීද? ගෘහ මූලිකයාට අලාභ විය. ගෘහ මූලිකයා ගැන දැනගත් ඔහුගේ විවාහය ද කැඩුණේ ය. ශුභ අශුභ බලන්නට ගොස් කැඩීම් කිහිපයක් ම සිදු විය.

- මැද බිත්තිය
- ලොකු පොල් ගස් දෙක
- ගෘහ මූලිකයාගේ කකුල
- ඔහුගේ කසාදය


දුවන්නන් වාලේ දුවන්නත් කරන්නන් වාලේ කරන්නත්, කියන්නන් වාලේ කියන්නත් පුරුදු අයට මේවා හොඳ පාඩම්.

මෝඩ කමට බෙහෙත් නැහැ. තවම සොයාගෙන නැහැ.


(සත්‍ය සිදුවීමක් ඇසුරිනි.)

**ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**
ලංසිගම

## අමිතගේ හද ගැස්ම......



# ඇදහිල්ලෙන් පෙරට යමු



"ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකයයි. අදෘශ්‍යමාන දේ පිළිබඳ නිසැක කමයි" (හෙබ්‍රෙව් 11:1) යන කියමන ඇදහිල්ලන් පිළිබඳ උචිතම ශු. බයිබලීය නිර්වචනයයි. ක්‍රිස්තියානි ජීවිතයේ මූලිකම නිර්ණායකය වන්නේ ඇදහිල්ලයි. වැඩිහිටි බව්තිස්ම ස්නාපන පිළිවෙතේ පූජා ප්‍රසාදි තුමන් ක්‍රිස්තියානිය අයැදුම් කරන ආධුනිකයාගෙන් විමසන්නේ "ඔබ දෙවියන් වහන්සේගේ ශු. සභාවෙන් ඉල්ලන්නේ කුමක් ද කියාය". ඊට ආධුනිකයා තනි වචනයක පිළිතුරක් දෙයි. ඒ තනි පදය බව්තිස්ම ස්නාපන පිළිවෙත තුළ අයැදුම් කරන සම්පූර්ණ ක්‍රිස්තු ජීවිතය සම්පිණ්ඩනය කොට දක්වයි. ඒ තනි පදය නම්, "විශ්වාසයයි". විශ්වාසය කරණ කොට ගෙන සදාතන ජීවිතය ඔහුට හිමි වන බව ඔහු ප්‍රසිද්ධයේ ප්‍රකාශ කරයි. විශ්වාසය සැබවින්ම ස්වර්ගීය ජීවිතය උරුම කර ගැනීම සඳහා අත්‍යවශ්‍යම සාධකය වේ. "අප්‍රේල් 21 වනදා පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට පස්සේ මම තාම පල්ලි ගිහින් නෑ. මගේ විශ්වාසය සම්පූර්ණයෙන් නැති වුණා". කියා එක් තරුණයෙක් දිනක් මා හා පවසද්දී තවත් පුද්ගලයෙකු පැවසුවේ ඒ ඛේදවාචකයම නොකඩව ඉරුදින පූජාවට යාමට ඔහුට හේතුවක් වූ බවත් ඒ සිද්ධිය හරහා ඔහුගේ දේව විශ්වාසය තව තවත් වැඩි වූ බවත් ය. එකම ඛේදවාචකයක් පුද්ගලයන් දෙදෙනකුට දෙයාකාරයෙන් බලපාන්නේ කෙසේ ද? එක් පුද්ගලයෙකු දෙවිඳුන් අත් හැර යාමටත් අනිත් පුද්ගලයා ගැඹුරින් දෙවිඳුන් අදහා ගැනීමටත් හේතුව කුමක් ද? යුරෝපයේ පමණක් නොව අප රටේ ද සැබෑ සමාජීය යථාර්ථය වන්නේ දෙවිඳුන් නැතැයි සිතන, දෙවිඳුන් සිටියත් තමන්ට එය අදාළ නොවේ යයි සිතන, දෙවිඳුන් සිටියත් නැතත් යහපත් ලෙස ජීවත් වීම පමණක් ප්‍රමාණවත් යැයි සිතන ද්‍රව්‍යවාදී චින්තනයක් ගොඩනැගී තිබීමයි. මීසම් මට්ටමින් සමාජ විද්‍යා නිර්ණායක මත පදනම් වූ පරීක්ෂණයක් කළහොත් අප කතෝලික තරුණ තරුණියන්ගෙන් සහ අප නව යොවුන් විය පසු කරමින් සිටින දරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් චේතනාන්විතව හෝ අහේතුකව ඉරුදින දිව්‍ය පූජාව හා දෛනික කතෝලික වත් පිළිවෙත් බොහෝමයක් අතපසු කරන බව පෙනී යයි. ඒ අතුරින් ඉතා සුළුතරයක් තමන් ප්‍රසිද්ධියේ අදේවවාදීන් යයි ප්‍රකාශ නොකළත් අදේවවාදයම තම ධර්මය කරගෙන ජීවත් වන බව පෙනේ. අධික වෙහෙස නිසා මෙන්ම කාර්ය බහුලත්වය හේතු කොටගෙන ඉරුදින දිව්‍ය පූජාව අතපසු වන බව ඇතැමෙක් පවසති. කතෝලික සභාවේ යල් පැන ගිය සිරිත් විරිත් යාවත්කාලීන විය යුතු බවත්, පියතුමන්ලාගේ දේශනා කාලානුරූපී නොවන අතර ධර්මයට පටහැනි දිවි පෙවෙතක් ඇතැමුන් ගත කරන බවත්, සභාවේ අඩුපාඩු කම් නිසා සභාව ගැන දැඩි කළ කිරීමකින් පසුවන බවත් යනාදි වශයෙන් නිදහසට කාරණ හුවා දක්වමින් අදේවවාදය ඉස්මතු කරන අතර ඇතැමකු තම සිත සනසවා ගැනීමට ප්‍රකාශ කරන්නේ ලෝකයට පෙනෙන ලෙස පල්ලි යන බොරු කරන අය නිසා ආගම ඇදහීම එපා වී ඇති බවත්, දෙවියන් වහන්සේ රැවටීමට පල්ලි යනවට වඩා පල්ලි නොයා යහපත් ලෙස ජීවත් වීම ප්‍රමාණවත් බවයි. ඉහත හැම ප්‍රකාශයක් ම ස්වානුකම්පාව, ස්වයං ආත්ම තෘප්තිය සහ ව්‍යාජ නිදොස් හෘද සාක්ෂිය ලොවට කියා පාන හුදු "සිත නිවන කතා" මිස යථානුරූපී ප්‍රකාශනයන් නොවේ. එයින් හැඟවෙන්නේ අන් කවරක් වත් නොව එවැනි පුද්ගලයන් අති බිහිසුණු වූ විශ්වාසයේ අර්බුදයකට (faith crisis) ඇතුළු වී බවයි. දුකට කරුණ නම් මෙවැනි පුද්ගලයන් බහුතරයක් පාරම්පරික කතෝලික පවුල්වලින් පැවත එන, පෞද්ගලික කතෝලික පාසල්වල අධ්‍යාපනය ලද, පූජා උදවු සමිතිය ඇතුළු මීසමේ සමිති සමාගම්වල කැපී පෙනුණු හා දහම් පාසලේ ශිෂ්‍ය නායකයන් සහ ඉහළ ලකුණු ලබා ගත් දීප්තිමත් දරුවන් ව සිටීමයි. එවැනි කිසිදු අධ්‍යාපනයක් හා මීසම හෝ පාසල හා බැඳි පුහුණුවක් ඇදහිල්ලට අංශු මාත්‍රයක

පෝෂණයක් කර නොමැති බව පෙනේ.

උපන් ගෙයි කතෝලිකයකු වීම හෝ පාරම්පරික කිතුනු පවුලකට අයිති වීම නිසාම කිතුනු විශ්වාසයට උරුම කම් කියන බව පිළිගැනීම ප්‍රලාපයකි. වෙසෙසින්ම කිවහොත් විශ්වාසය යනු දේව තිළිණයකි. දෙවියන් වහන්සේ ඒ තිළිණය ප්‍රකාශ කරන්නේ තමන් කැමති වූවන්ටය: "දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබූවන්ට එනම්, උන්වහන්සේට ප්‍රේම කරන අයට, සියල්ලෙහි දීම උන්වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු" (රෝම 8:28). හෙබ්‍රෙව් ලිපිය සඳහන් කරන ආකාරයට "ඇදහිල්ලෙන් ආබ්‍රහම් කැඳවනු ලැබූ කළ ඔහු තමා යන්නේ කොහේදැයි නොදැන තමාට උරුමයක් පිණිස පසුව ලැබෙන්නට යන ස්ථානයකට පිටත් වී යන ලෙස කීකරු වී නික්ම ගියේය" (හෙබ්‍රෙව් 11:8). මින් ගම්‍ය වන ප්‍රධානම කරුණ ඇදහිල්ල යනු කීකරුකමේ ප්‍රතිඵලයකි. දෙවියන් වහන්සේ අපට කරන්නට කියා අණ කරන ඒ මහා කර්තව්‍යය අපට තේරුණත් නැතත් අපට එය කරන්නට කියන උන්වහන්සේ අප සමඟ සිටිනා බව දන්න නිසා අන්න ඒ විශ්වාසය තුළ එය සිද්ධ කිරීම අප සියලු දෙනාගේම යහපතට හේතු වේ. "ඇදහිල්ල යනු දෙවියන්වහන්සේ කෙරෙහි පුද්ගලයකු තබන විශ්වාසයයි". එනම්, සියල්ලෙහි දී ම ඔහුගේ යහපත පිණිස දෙවියන් වහන්සේ ක්‍රියා කරන බවත් ඔහුගේ සෞභාග්‍යය පිණිස මිස විපත්තිය පිණිස නොවන බවත් ඔහු පිළිබඳව වඩා පරිණත සැලසුම ඇත්තේ දෙවියන් වහන්සේට බවත් ඒ පුද්ගලයා විශ්වාස කිරීමයි (ජෙරමියා 26:11). දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ප්‍රකාශ විය යුත්තේ ක්‍රියාව මගිනි. එය හුදෙක් වචනයකට හෝ දේශනයකට හෝ අන් මිනිසුන්ට දෙන උපදේශනයකට සීමා විය යුත්තක් නොවේ. ඇදහිල්ල ක්‍රියාත්මක විය යුත්තේ කැළඹිලි පසුබිමකයි. අරගලයක් පවතින තැනක ඇදහිල්ල තීව්‍ර වේ. ඒ පිළිබඳ හොඳම නිදසුන අපේ කාලය අපට ලැබුණා කොවිඩ් වසංගතය මගින්. කොවිඩ් වසංගතය අති බිහිසුණු මට්ටමකට 2020 වසරේ අප්‍රේල් මාසයේදී පත් වෙනකොට මුළු ලොවක් වසා තිබුණු පසුබිමක ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පාප් වහන්සේ හිස් වුණ වතිකාන චතුරස්‍රයට තනිවම වැස්සක ගමන් කළා. මුළු ලොවක් සසල කර ඒ තනිව ගමන් ගත් දර්ශනය අප කාගේත් සිත් වේදනාවට පත් කළා. අප කවදාවත් දැක තිබුණේ නැහැ ශුද්ධෝත්තම පියතුමන් වතිකානු චතුරශ්‍රයේ තනිව ඇවිදින දසුනක්. සැම විටම අපි දැක්කේ හිස් වලින් පිරී ඉතිරී ගිය ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ ඔල්වරසන් අත්පොළසන් යාච්ඤා ගිගුම්දීම් මැද විරාජමානව වඩින රජකු සේ පාප්තුමන්ගේ සම්ප්‍රාප්තියයි. එහෙත්, මුළු ලොවක් වසා තැබූ සවසක ශුද්ධෝත්තම පාප් වහන්සේ හිස්වූ වතිකාන චතුරස්‍රයට මඳ වැස්සක් නොතකා ඇතුළු වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ප්‍රධාන දොරටුවෙන් එළියට වැඩමවා මුළු ලොවක් ආසිරි ගැන්වූ සේක. එහිදී උන්වහන්සේ කළ දේශනාව අදටත් මාගේ මනසේ රැව් පිළිරැව් දෙයි. උන්වහන්සේ එදා මතක් කළේ ජේසුස් වහන්සේ දිනක් ශ්‍රාවකයන් සමඟ ගෙනෙසෙරෙත් විලේ ගමන් කරමින් සිටි බවයි. හදිසියේ ඇතිවූ චණ්ඩ මාරුතයක් හේතුවෙන් ඔවුන් ගමන් ගත් ඒ යාත්‍රාව ගිලෙන්නට ආසන්න වූ විට ඔරුවේ අවරය මත නිදා සිටි ස්වාමීන් වහන්සේව ශ්‍රාවකයන් විසින් අවදි කරනු ලබන්නේ සමිඳුනි අප ගිලෙන්නට ආසන්න යැයි කියමිනි. ශුද්ධෝත්තම පියාණන් වහන්සේ එහි දී අවධාරණය කළේ බිය වූයේ අන් කවරකුත් නොවේ මුහුද ගැන හොඳින්ම දැන සිටි ධීවරයන් බහුතරයක් බවයි. පත්ව තිබූ කාලගුණික විපර්යාසයත් ජලයේ කැළඹිල්ලත් ඔවුන්ව තවත් කැළඹිල්ලකට මිස ඇදහිල්ලට ගෙන ආවේ නැත. එහෙත් අවරේ මත නිදාගෙන සිටි සමිඳාණන් වහන්සේ කෙළින් සිට මුහුදට අණ කිරීමෙන් අනතුරුව ඒ රළ පහර නිශ්චල වන විට ඔවුනට පසක් වන්නට ඇත්තේ ජුදෙව්වන් නිරන්තරයෙන් ගැයූ ගීතාවලියේ 46 වන පරිච්ඡේදයේ දහවන පදය, එනම්, "නිශ්චල වන්න. මා පමණක් දෙවිඳුන් බව සිතට ගන්න" යන වදන විය හැකිය. මෙහිදී ස්වාමින් වහන්සේ සිය ශ්‍රාවකයන්ට දුන් ගැඹුරු පණිවුඩය නම්, "මා කෙරෙහි විශ්වාස කරන්න. සියල්ල පාලනය කරන්නේ මගේ පියාණන් වන දෙවියන් වහන්සේ මිස ඔබ ඉදිරියේ ඇති කැළඹිල්ල නොවේ. එසේ නම්, ඔවුන් ඉදිරියේ මා නුඹ නොකළඹන පිණිස දැන් ඔවුන් ගැන ඔබ නොකැළඹී සිටින්නැ"යි සමිඳාණන් වහන්සේ ජෙරමියා දිවැසිවරයා මගින් කියවන ලද කීම අප ජීවිත අරගලවලදී ඉෂ්ට වන බව අපි අත් දකින්නෙමු. ශුද්ධෝත්තම පාප් වහන්සේ එදා වතිකාන චතුරශ්‍රයේ තනිව සිටගෙන ඒ වැස්සේ ලෝකයටම අනුශාසනා කළේ මුළු ලෝකයත් සමිඳාණන් වහන්සේගේ බෝට්ටුවේ නිදාගෙන ඉන්න අතරතුර ගිලෙන්නට යන භයානක කුණාටුවකට මැදි වී සිටින බවත්, එදා ශ්‍රාවකයන් "අප මරණාසන්න ය. අප ගලවාගත මැනවැ"යි කෑ ගැසුවා සේ මුළු ලොවක් ඇදහිල්ලේ නියමුවාණන් හා කර්තෘවරයාණන් වන දෙව් මහෝත්තමයාණන් වෙත හැරී උන්වහන්සේ කෙරෙහි

විශ්වාස කළ යුතු බවයි. අපේ වේදනාවේ දී පීඩාවේ දී අන් කවරදාකටත් වඩා සමිඳාණන් වහන්සේ ජීවමාන වන සේක ය යන්න අපගේ හුදු අත්දැකීමයි. එදා කොවිඩ් ව්‍යසනය මැද සමිඳාණන් වහන්සේ විසූ සේක. උන්වහන්සේ ලෝක ජනතාව දුකට පත් වෙද්දී ඒ දුක බෙදා ගත් සේක. "මරණය වැනි ගනඳුරු රුදුරු නිම්නය මැදින් ගියත් ඔබ මා සමඟ බැවින් මට කිසි බියක් නොවන්නේය. ඔබේ කෙවිට ද සැරයටිද මා නියත සැනසිල්ල වන්නේයැ"යි ගීතාවලිය 23 වන ගීතිකාවේ දාවිත් රජතුමා පවසන මරණයේ රුදුරු මිටියාවත ලොවක් ලෙස, රටක් ලෙස, ජාතියක් ලෙස අපි පසු කළෙමු. පසු කරමින් සිටින්නෙමු. එහෙත් සමිඳාණන් වහන්සේ අප අත් නොහළ සේකැයි අපි අදහමු. උන්වහන්සේ අන් කවරදාකටත් වඩා මේ වර්තමානයේ දී අප තුළ අපේ අගහිඟකම් තුළ අපේ විරැකියාව තුළ අපේ ඇබ්බැහීන් තුළ අපේ විනාශ වූ පවුල් සබඳතා තුළ ජීවමානව සිටින බව අපි අදහමු. ඒ ඇදහිල්ලට සාක්ෂි දරන කතෝලිකයෝ වෙමු. එනිසා ඇදහිල්ලේ ව්‍යසන, සමාජ විපර්යාස හා දේශගුණික විපර්යාසය අපට ආරාධනා කරන්නේ කිතු සමිඳුන්ගේ දිශාවට හැරීමටයි. එදා ආබ්‍රහම් පියතුමන් තමන්ට යන්නට කී දේශයට ගොස් තමන්ට පොරොන්දු පිණිස දෙන්නට යන ඒ පොරොන්දු දේශයේ දී ආගන්තුකව සිටි බව හෙබ්‍රෙව් ලිපිය නැවත සිහි කරයි. එය කානාහි තමන්ටම අයිති ගෙදරක තමන් කුලී පදනම මත සිටින තත්ත්වයකි, විකෘතියකි. නමුත් ඇදහිල්ලේ විකෘතිය හරහා ආබ්‍රහම් ගමන් කරන්නේ එල නොදැරූ හිස් කුසක් සමඟයි. තම බිරිඳ වන සාරා අවුරුදු අනූවක් වයසැති කාන්තාවක වූ නමුත් තවමත් පල දරා නැත. ආබ්‍රහම් සහ සාරාගේ කතන්දරේ දුක්මුසු තැන, ප්‍රතිඵලයක් නැති තැන වන්නේ, අරගලය තමන්ගේම කියා කිව හැකි දරුවකු නොසිටීමයි. එනම් දේව අණට කීකරු වන්නේ තම නිසරුබව තුළයි. පිළිතුරක් නැති අසරණ බව තුළයි. සමිඳාණන් වහන්සේගේ අණට කීකරුව ඔහුට පොරොන්දු දේශයට තික්ම ගොස් එහි ආගන්තුක ව හෝ වෙසෙන්නේ දෙවියන් වහන්සේ කෙරෙහි තිබෙන ඇදහිල්ල අංශු මාත්‍රයකුදු වෙනසක් කරගෙන නොමැති නිසයි. උන්වහන්සේ ද ඔහුට පොරොන්දු වූ පොරොන්දුවේ දරුවා හෙවත් ඊසාක් වැඩිකල් නොගොස් නැවත දවන යාග පූජාවක් ලෙස අල්තාරයක ඔප්පු කරන්නැයි කියමින් ආබ්‍රහම් තුමන්ගේ හදවත බිඳින්නට සලස්වයි. සැබැවින්ම ආබ්‍රහම්ගේ හදවත බිඳීමට වඩා දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ ඔහුගේ හදවත නොබෙදී එක්සිත්ව තබාගැනීමයි. මක්නිසාදයත් බෙදුණු හදවතකින් දෙවියන් වහන්සේට හා තම දරුවාට එකවිට සේවය කළ නොහැකි බවත්, ආදරය කළ නොහැකි බවත් දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට මෙහිදී ඒත්තු ගන්වන සේක. මහලු වයසේ දී ලද පුත්‍රයා හේතුවෙන් ආබ්‍රහම් තම දෙවියන් වහන්සේට වඩා තම පුත්‍රයාට ඇලුම් වන බව උන්වහන්සේ දුටු සේක. දෙවියන් වහන්සේට මනුෂ්‍ය ආත්මය කෙරෙහි ඇත්තේ සා පිපාසාවකි. ප්‍රමුඛත්වය දෙවියන්ට නොදී තම දරුවාට දීම ආබ්‍රහම්ගේ විශ්වාසයේ දුර්වලම තැනයි. දෙවි සමිඳාණන් වහන්සේ ස්පර්ශ කරන්නේ ඒ දුර්වල තැනයි. දෙවියන්ට දිය යුතු දේ දෙවියන්ටත් මේ ලෝකේ භූතාධිපතීන්ට දිය යුතු දේ භූතාධිපතීන්ටත් දෙන්න සමිඳාණන් වහන්සේ මිනිසා මෙහෙය වූයේ ලෝක ආරම්භයේ සිටයි. ආබ්‍රහම්ගේ වරද වූයේ ඔහු තම මහලු වයසේ ලද පුත්‍රයාට දැඩි ලෙස ප්‍රේම කිරීම ම නොව දෙවියන්ට දිය යුතු ප්‍රමුඛතාව තම පුතාට දීමයි. දෙවියන් වහන්සේ ඇදහිල්ලේ ගමනක නිරත වන හැම කෙනකුගෙන්ම බලාපොරොත්තු වන්නේ සියල්ලට ඉහළින් සියල්ල ඒකාබද්ධ කරන ප්‍රේමය වන උන්වහන්සේට හදවතින් පිළිතුරු දීමයි. ඒ පාඩම පූජනීය හෙළ මුදුනේ දී ආබ්‍රහම්තුමන් ඉගෙන ගන්නේ දර සෑය මත තම පුතු තබා පිහිය ඉහළට ඔසවා පහළට ගෙනෙන අතර දේවදූතයාගේ මැදහත් කමින් දරුවාගේ මරණය සිදු නොවී ආබ්‍රහම්ට නොබෙදුණු හදවතකින් දෙවියන්ට ප්‍රේම කිරීමේ වැදගත්කම නමැති ධර්ම අවබෝධය ලබා දීමයි. ආබ්‍රහම්ගේ ජීවිතයේ සිය වසරක දීර්ඝ ප්‍රතිඵලයක් නැති අඳුරු කටුක රළු ජීවිතයේ ගැඹුරුම ඇදහිල්ලේ අත්දැකීම් ලැබුවේ අවුරුදු සියයක පොරොන්දුවක් ඊසාක් තුළ ඉෂ්ට වීමෙන්ම නොවේ. ඔහු ගැඹුරුම ඇදහිල්ලේ පතුල සොයා ගියේ තම දරුවාගේ මරණාසන්න අත්දැකීම් තුළයි.

මින් අපට ගම්‍ය වන ප්‍රධානම කාරණය නම් ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකයයි. අදෘශ්‍යමාන දේ පිළිබඳ පැහැදීමයි. අප ඇදහිල්ල තීව්‍ර වන්නේ අරගලයක් හෝ ඊට එරෙහි වන බාධාවක් තුළ බව සමිඳාණන් වහන්සේ දේව වචනයේ අනුප්‍රාණයෙන් අපට උගන්වන සේක. ඒ නිසා අපද කළ යුතු වන්නේ අප කඩා වැටීම්වල ප්‍රතිඵල නොමැති තැන්වල අරගලවලදී ඇදහිල්ලේ පරිපූර්ණකයාණන් සහ පූර්වා දර්ශය වන සමිඳාණන් වහන්සේගේ කරුණාවේ සිංහාසනය වෙත දිව යාමයි. ශු. පාවුලු තුමා 1 කොරින්ති ලිපියේ දහතුන් වන පරිච්ඡේදයේ 13 වගන්තියේ සඳහන් කරන

ආකාරයට විශ්වාසය, බලාපොරොත්තුව සහ දේව ප්‍රේමය යන කිතුනු ගුණාංගවලින් අප ජීවිත සරසා ගත යුතුයි. පුරාණ ගිවිසුමේ ජනප්‍රිය ආප්තෝපදේශය උගන්වන ආකාරයට සමිඳුන් කෙරෙහි දැඩිව විශ්වාස කරන මිනිසා භාග්‍ය ලද්දෙකි. ඔහු ගං ඉවුරේ සිටුවා ඇති ගඟටම මුල් ඇද ඇති ගිම්හානයට කිසි බියක් නැති කොළ පරවී යාමක් නැති හැමදා සරුසාරව පළ දරන ගසකට සමාන යැයි කියැවෙන රූපකය අපේ ආත්මය තුළ පැළ පදියන් කර ගැනීම කිතුනු අපගේ වගකීමයි. ගීතාවලියේ 118 ගීතිකාවේ කියවෙන ආකාරයට භූතාධිපතීන් හෝ මෙලොව අධිපතීන් හෝ මිනිසා කෙරෙහි විශ්වාසය තැබීමට වඩා දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත බව සිතට ගැනීම අප කිතුනු වගකීමයි. ඇදහිල්ල දිනෙන් දින බාල්දු වන හීනවන විශ්වාසය අප ඇදහිලිවන්තයන්ගෙන් ගිලිහෙන සමාජයකට ඇතුළුවන අපි සමිඳාණන් වහන්සේගේ යුගාන්ත වාදී ප්‍රකාශනය ද අමතක නොකළ යුතුයි. මනුෂ්‍ය පුත්‍රයාණන් නැවත මෙලොවට පැමිණෙන විට ඔහුට ඇදහිල්ල හමුවේද යන සාධාරණ පැනය අප නිරන්තරයෙන් සිහි කැඳවා ගත යුතුයි. දිව්‍ය පූජාවේ වත්පිළිවෙත් පමණක් නොව දේව වචනය පෙරළන විට කියවන විට නිරන්තරයෙන් අප සවන් වැකෙන සමිඳාණන් වහන්සේ ඔබ සමඟ වන සේක්වා යන ප්‍රාර්ථනය ඉඟි කරන්නේ අන් කවරක් නොව ඇදහිල්ලයි. එනම්, උත්ථාන වූ ස්වාමින්වහන්සේ ඔබ තුළ ජීවමාන වන බවයි. උන්වහන්සේ අප තුළ ජීවමානව වාසය කරන සේක් නම්, අපට එරෙහි වන්නේ කවරකු ද? ශුද්ධවූ පාවුලු තුමා රෝමවරුන්ට ලියූ ලිපියේ පවසන ආකාරයට භූතාධිපතීටවත් මරණයටවත් කඩුවටවත් මොන බලවතාටවත් ක්‍රිස්තු ප්‍රේමයෙන් අප වෙන් කළ නොහැකි බව අප විශ්වාසය කළ යුතුය. ඒ විශ්වාසය අපට ජීවත් වීමට බලාපොරොත්තුවක් ගෙන දෙයි. ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට වැඩියේ ඇදහිලිවන්තයන් බිහිකිරීමටයි. සමිඳාණන් වහන්සේ තමන්ගේ දෙවියන් බව ආදරණීය පියාණන් බව සකල ලෝක ජාතීන් දැන ගැනීමට සැලැස්වීමටයි. ඒ ආදරේ මහා විප්ලවය මේ පොළොව තුළ යථාර්ථයක් වන්නට පියාණන් වහන්සේ අභිප්‍රාය වන්නේ යම්සේද, එසේම උන්වහන්සේ ඔබට මට ප්‍රේමය තුළ කතා කරන සේක. ඒ හඬගැසීමට අපි කීකරු වෙමු. කීකරු විය යුත්තේ ඇදහිල්ලෙන් පිළිතුරක් දීමෙනි. අපගේ අරගලයේදී පීඩාවෙදි අපගේ ජීවිතයේ "ඒලි ඒලි ලාමා සබක්තානී" (මතෙව් 27:46), "එලොයි, එලොයි, ලාමා සබහ්(ත්)තානී" (මාක් 15 : 34) හෙවත් මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත් අත්හැරියේ මන්ද කියා මොර ගසන කුරුසියේ ගාවිනාවේ දී අප සමිඳාණන් වහන්සේ වෙත බලමු. උන්වහන්සේ වෙත හැරී යමු. උන් වහන්සේගෙන් නික්මෙන දේව දයාවේ උල්පත කෙරෙහි පිපාසා වෙමු.

සා. දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ තම ජීවිත කාලයේ ප්‍රසිද්ධ වන්දනා පිළිවෙත් සහ විදේශ ජාතීන් හමුවේ පැවැත්වූ දැවැන්ත වේදිකාවල ශ්‍රවණාගාරවල සංවිධානය කරන ලද දිව්‍ය පූජා හා ජන හමුවීම් හැම එකකම වාගේ විශාල ප්‍රමාණයේ ශුද්ධ වූ කුරුස ප්‍රතිමාවක් තබන්නට අණ කළ සේක. සා. දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ එසේ අණ කළේ ස්වකීය දේශනා අතරතුර ශබ්ද නගා කෑ ගසා කුරුසිය දෙස බලන ලෙස ජනතාවට ආයාචනා කිරීමටයි. දේශනා අතරතුර කුරුසිය දෙස බලමින් සැදැහැවතුන්ට උන්වහන්සේ ආරාධනා කළේ ඔබ වේදනාවෙන් සිටින විට ඇදහිල්ල ප්‍රශ්න කරන විට ඔබේ බලාපොරොත්තු දිනෙන් දින සුන් වන විට ඔබ මරණාසන්නව සිටින විට කුරුස පාමුලට පැමිණ කුරුසිය දෙස බලා කුරුස පත් වූ සමිඳාණන් වහන්සේ දෙස බලන ලෙසයි. ඒ බැල්ම ම ඇදහිල්ල ඔබ තුළ ජනිත කරවන බව ශුද්ධෝත්තම පාප් වහන්සේ අනුශාසනා කළ සේක. ඒ බැල්ම ජීවත්වීමට ඔබට බලාපොරොත්තුවක් දෙන සේක. ඒ බැල්ම ඔබ තුළ දේව ප්‍රේමය ජනිත වන බව ස්ථිරව ප්‍රකාශ කරන සේක. විශ්වාසය, බලාපොරොත්තුව හා දේව ප්‍රේමය යන වටිනාකම ඔබ අත්විඳින්නේ කුරුස පාමුල ඔබේම අරගලය පියාණන් වහන්සේගේ පාමුල තබන විටයි. කිතු සමිඳුන්ගේ කුරුස යාගයේ වේදනාවත් ඔබගේ ඇදහිල්ලේ ගාවිනාවත් දෙකක් නොව එකක් ම යි.

කුරුසේ නැග අත් විහිදා
ඔබේ දෑසින් ලොව බලලා
ඔබ හා මා හා ඉඳිමු
කුරුසේ සිටිනා සමිඳේ

දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා.

ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා
මීසම් සේවක
සා. ස්නාවක ජුවාම් දේවස්ථානය
මෝදර

# CHALLENGES TOWARDS FAITH IN THE MODERN WORLD ACCORDING TO NEW TESTEMANT

The New Testament, which is now called as Second Testament finds the fulfillment of God's promise of Salvation in the person of Jesus Christ, our Redeemer. This is to say that New Testament is about, Jesus's life and ministry inclusive of his paschal mystery (Passion, Death, and Resurrection of Jesus) and the development of Christianity in the ministry and preachings of his Apostles and Disciples. Faith is not a concept new to be found in the NT only, rather a foundation of Christian life that finds its root throughout the Scripture, but in the NT, it particularly takes a turn as "Faith in Jesus Christ". The beginning of such faith is the story of Annunciation narrated at the beginning of Gospel of Luke as Mary was called to believe the whole picture of Salvation in the Incarnation of Jesus Christ through 'GREAT CONSENT' of FIAT by Blessed Virgin Mary. Hence, Mary becomes a model of Faith in the New Testament even prior to all apostles and disciples.

Now the Question is, "What is Faith according to NT?" Faith in General is a state and a call to believe in God and God's promise even when one does not exactly understand everything that is to take place. It is related to what is not yet seen, perceived, experienced, and understood. However, one believes on that not really knowing what it is, but being convinced that God will act on behalf of the person, irrespective of all uncertainties and changing realities. This is built on the principle "NOTHING IS IMPOSSIBLE WITH GOD" without any wavering Mind at any situation of life. This takes us to the next question, "Is such FAITH possible in the modern world?" The modern world is not settled on anything. It is on the movement as tossed up by various influences, like ideologies, scientific theories, technological dictatorship, human issues, lack of commitments, economic crisis, politics, Global issues, destruction of cosmos, entertainment overloading, and questions concerning meaning of life. With all these, "Where is the role of God? as understood by human and as expected or believed by human being. Do the theists genuinely believe that "NOTHING IS IMPOSSIBLE TO GOD" and commit themselves with the same FIAT "I am the handmaid of the Lord, let it to me according to THY WILL". Does God's will find place in the realm of modern human being in the modern world. Therefore, the confrontation of faith in the life of modern human person unfolds many challenges in all departments of life. What are those challenges?

The challenges TOWARDS FAITH are twofold;internal, and external. The internal challenges refer to the state of human person in which one finds oneself unable to get into the disposition of Blessed Virgin Mary to believe God's words and role in one own life amid uncertainties. The external challenges are those that externally prevent or hinder a person as means or causes from committing into the framework of Blessed Virgin Mary to God-Human relationship in the context of life. The internal challenges can be fear, spiritual ignorance, lack of prayers, lack of God-experience, lack of Consciousness of God's presence in life, lack of commitment, lack of meditation in daily life, confused mentality, pre-occupations of unnecessary questions of ever remaining skepticism etc. The external challenges can be like, political, economic, religious, technological, and various other reasons that question our faith from outside of human person but present in the modern human society.


Can I end with opening and identifying the challenges towards faith in the modern

world? If I end here, it is like one sees the wound and goes un-attending. Such act would not help for any recovery of health and for any renewal. Therefore, attending to this opened wound is essential. To do that, (primarily) one should internally prepare oneself in union with God, giving enough space to encounter God in one's own life. Whether one understand or not what God does in my life, allow God to act being open in prayer and meditation. One should reflect the reality of life as it opens new phases and dimensions in everydayness in the modern world. Be rooted to the principles of Value-system found in the Gospels. Be consciousness, faith is always in the paradoxical realm that can seems to be absurd to many, but meaningful to the one who goes through life as related to God daily. In short, it is an effort to be spiritually disposed daily irrespective of falls and failures, beginning to believe in God's grace and mercy.

The next is (secondary) is not to give too-much power to outside realities as to dictate terms on one's life, but to believe that "ALL WILL PASS BY". Every external challenge coming from external sources/causes are momentary, and they do not have power to dictate terms on my/one's own life unless one permits them. The modern world is full of information, but it is I/SELF must have a meaning, find a meaning, find a path as Mary did it in faith; and then, commit in the process of journey. The challenge towards faith in the modern world according to New Testament is "Do you/SELF have faith to begin with to live your life meaningfully in relation to God?" **IF ONE HAS A FAITH AT THE BEGINNING OF LIFE JOURNEY, AND IF ONE CAN SUSTAIN THE SAME FAITH IN THE PROCESS OF JOURNEY WITHOUT LOSING IT, SUCH LIFE NEVER ENDS WITH DEATH, BUT GOES BEYOND DEATH AS CONNECTED TO THE RISEN LORD.** Look at Blessed Virgin Mary at Annunciation and begin the way to meet life in faith. One will find the Way in Jesus Christ.

**Rev. Fr. Michael Devin Coonghe IVDei**

## ගුටි කන්න බෑ ටීචර්



එළි වෙද්දි හැමදාම දිවුරලා කිව්වා
ඊත් මහ රෑ වෙද්දි මත් වතුර බිව්වා

හැමදාම ගෙට එද්දි රෑ දොළහ පැන්නා
වෙරිමතේ ඇවිදිල්ල ගේ දෙකක් කෙරුවා

අම්මාගේ අඩුපාඩු නිතරෝම හෙව්වා
කන්න ගත් බත් පතත් බිම දමල ගැහුවා

කෑවා මගෙ ජීවිතේ කිය කියා බැන්නා
හිටි ගමන් අම්මටත් ලීවලින් ගැහුවා

දකින වාරය ගානෙ හිත බියෙන් ගැහුනා
දොර අස්සෙ හැංගිලා රෑ තිස්ස ගෙව්වා

ජීවිතේ රැකගන්න ගෙන් ගෙටත් දිව්වා
මොන වැඩද ටීචර් මට හිත බියෙන් ගැහුනා


රෑ තිස්සෙ හැමදාම යුදබිමක් මැවුණා
නින්ද නැති දින මාස ගොඩක් මං ගෙව්වා

එන්න ඕනම නිසා ඉස්කෝලෙ ආවා
ගුටි කන්න බෑ ටීචර් මෙන්න මං වැන්දා

එරන්දි එම්. සේනාරත්න

## මුනිවර චරිත 05

# ශු. තෝමස් ඇක්වයිනාස් මුනිතුමා



ක්‍රි. ව. 1224 දී ඉතාලියේ රොක්කාසෙක්කා (Roccasecca) නම් වූ ප්‍රදේශයේ තෝමස් ඇක්වයිනාස් මුනිතුමා උපත ලැබීය. ඔහු නේපල්ස් (Naples) විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලද්දේය. වංශවත් පවුලකින් උපත ලද ඇක්වයිනාස් තුමා තම දෙමාපියන්ගේ විරෝධය මැද දොමිනිකානු නිකායට ඇතුළත්ව පැරීසියේ තාපසාරාමයේ අධ්‍යාපනය ලැබීය. ඉන්පසු කොලෝන් (Cologne) විශ්ව විද්‍යාලයේදී මහා ඇල්බට් දේවධර්මාචාර්යවරයාගෙන් ඉගෙනීම ලැබ, 1250 දී පූජාප්‍රසාදිවරයෙක් විය.

තෝමස් ඇක්වයිනාස් තුමා තම ක්‍රිස්තියානි චින්තනය සඳහා ආභාසය ලද ප්‍රධාන මූලාශ්‍ර දෙකකි. ඉන් පළමුවැන්න වන්නේ හිප්පෝ හි අගෝස්තීනුගේ දේව ධර්ම චින්තනයයි. දෙවනුව ඇරිස්ටෝටල්ගේ දර්ශනවාදයයි. තෝමස්ගේ දේව ධර්ම චින්තනය ඇරිස්ටෝටල්ගේ දර්ශනවාදයෙන් තොරව තේරුම් ගැනීම අපහසුය. තෝමස් ඇක්වයිනාස් අධ්‍යාපනය ලැබූ නේපල්ස් විශ්ව විද්‍යාලය (1239 - 1244) ඇරිස්ටෝටල් දර්ශනය ඉගැන්වූ ස්ථානයයි. මේ වකවානුවේ පැරීසියේ ශිෂ්‍යයන්ට ඇරිස්ටෝටල් පිළිබඳ හැදෑරීම තහනම් කොට තිබිණි. කෙසේ වෙතත් ඇරිස්ටෝටේලියානු ස්වභාවික දර්ශනවාදය (Natural Philosophy of Aristotle) මෙන්ම බොහෝ දුරට ඇරිස්ටෝටේලියානු පාරභෞතිකවාදය (Aristotelian Metaphysics) තෝමස් තුමන් ඉගෙන ගන්නට ඇතැයි සිතිය හැකිය.

තෝමස් ඇක්වයිනාස් තුමන්ගේ ගුරුවරයා වූ මහා ඇල්බට්ගෙන්ද, ඇරිස්ටෝටල්ගේ ආභාසය ඔහුට ලැබිණි. ඊට හේතු වූයේ ඇරිස්ටෝටල්ගේ දර්ශනය පිළිබඳ විශ්ව කෝෂයක් ලිවීමට ඇල්බට් තුමන් කටයුතු කිරීමයි. ඇරිස්ටෝටල්ගේ දර්ශනය පුළුල් ලෙස විග්‍රහ කිරීම හෝ ඉදිරියට ගෙන යාම ඇල්බට් දේවධර්මාචාර්යවරයාගේ අරමුණ නොවීය. මන්ද, ඇරිස්ටෝටල් මිථ්‍යාදෘෂ්ටික දාර්ශනිකයෙකි. එනිසා, ඔහුගේ කෘති හැදෑරීමෙන් ක්‍රිස්තියානීන්ට හානියක් විය හැකි යයි ඒ යුගයේ පැවති පිළිගැනීමයි.

ඇරිස්ටෝටල්ගේ කෘති තෝමස් ඇක්වයිනාස් තුමන් විසින් අධ්‍යයනය කළේ පරිවර්තන හා පරිකථා (Commentaries) මගින්ය. කෙසේ වෙතත් ඇරිස්ටෝටල්ගේ දර්ශනය ග්‍රීක භාෂාවෙන් තෝමස් ඇක්වයිනාස් අධ්‍යයනය කළේ යැයි කිව නොහැකිය. ඇරිස්ටෝටල්ගේ දාර්ශනික චින්තනය ඉගෙනීමට තෝමස් ඇක්වයිනාස් තුමන් උත්සාහ කළේ ඒ යුගයේ ඇතැන්ස් (Athens) හා රෝමය සඳහා එය ආභාස කොට ගත් ආකාරය තේරුම් ගැනීමට නොවේ. ඇක්වයිනාස් තුමන්ගේ අරමුණ වූයේ ඇරිස්ටෝටල්ගේ චින්තනය ඒ යුගයේ පැරීසියේ ජන සමාජයට අදාළ වන්නේ කෙසේදැයි යන්න විමසා බැලීමටය. එලෙසම ක්‍රිස්තියානි විශ්වාසය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට ඇරිස්ටෝටල් චින්තනය ආධාර වන්නේ කෙසේදැයි යන්න පැහැදිලි කර දීමටය.

තෝමස් ඇක්වයිනාස් මුනිතුමන් අයත් වූ දොමිනිකානු නිකාය නැමති පූජක පන්තියේ අරමුණ වූයේ ශුද්ධ ලියවිල්ල පිළිබඳ අධ්‍යයනයන්ය. ඒ ප්‍රයත්නයේදී ශුද්ධ බයිබලයේ නව අනුවාද හෙවත් සංස්කරණයන් (Revised editions), ශුද්ධ බයිබලයේ සමපද අකාරාදිය (Bible Concordance), සහ ශුද්ධ බයිබල් පරිකථා (Bible Commentaries) මූලික විය. මේ පූජක පන්තිය සමග එක්ව තෝමස් ඇක්වයිනාස් මුනිතුමන්ද, ශුද්ධ ලියවිල්ලේ පැරණි සහ නව ගිවිසුම සඳහා බොහෝ පරිකථා ලේඛන ගත කළේය. එහිදී ශුද්ධ බයිබලීය අර්ථ විග්‍රහය පිළිබඳ මූලික අධ්‍යයනයක් වෙත ඔහු යොමු විය.

මේ පසුබිම තුළ අපට නිගමනය කළ හැකි

වැදගත් කරුණක් නම් ඇක්වයිනාස් තුමන් ක්‍රිස්තියානි චින්තනය ලේඛනගත කළේ දේව ධර්මය බුද්ධිමය ආකාරයෙන් හදාරන්නන් සඳහා වන බවයි. ඔහු තම කෘති සම්පාදනය කළේ ශිෂ්‍යයන් සහ තමන්ගේ සහෝදර ආචාර්යවරුන් අරමුණු කරගෙනය. තෝමස් ඇක්වයිනාස් තුමන්ගේ කෘති ලතින් භාෂාවෙන් රචනා විය.

එතුමන් විසින් තම චින්තනය ඉදිරිපත් කළේ ඔහුටම විශේෂ වූ ක්‍රමවේදයකට අනුවය. නිදසුනක් ලෙස දක්වන්නේ නම් ඔහුගේ "දේව ධර්ම සංක්ෂේපය" (Summa Theologiae) නැමති කෘතියෙන් මෙම විශේෂ ක්‍රමවේදය අපට හඳුනා ගත හැකිය.

ඇක්වයිනාස් මුනිතුමන්ගේ ක්‍රිස්තියානි චින්තනය පිළිබඳ වැදගත් ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

1. බුද්ධියේ බලය හඳුනා ගැනීම
2. දැනුම ලැබෙන ක්‍රම විධි
3. එකිනෙකට සබැඳි විෂයය ක්ෂේත්‍ර දෙකක්

තෝමස් ඇක්වයිනාස් නම් වූ ක්‍රිස්තියානි චින්තකයා ක්‍රි. ව. 1274 දී ලියෝන් නුවර සම්මේලනයට (The Council of Lyon) ආරාධනා ලැබ, එහි යන අතරතුර රෝගාතුරුව මිය ගියේය.

තෝමස් ඇක්වයිනාස් තුමන්ගේ ප්‍රධාන කරුණු සාරංශයක් ලෙස,

- තෝමස් ලැබූ ආභාසයත්, අගෝස්තීනු හා ඇරිස්ටෝටල් මගින්
- දායකත්වය - විශ්වාසය හා බුද්ධිය අතර සම්බන්ධය ගෙන හැර දැක්වීම හා දේව ධර්මය ක්‍රමානුකූල කිරීම

තෝමස් ඇක්වයිනාස් තුමන් තම කෘති රචනා කළේ, දේව ධර්මය ඉගෙන ගන්නා අයට මිස ඒ කෘති මූලිකවම එඬේර සේවය සඳහා නොවීය. එනිසා ඔහුගේ ලේඛන සංක්ෂිප්ත, පැහැදිලි හා ඉතා නිවැරදි විය.

**සැකසුම :**
**ගරු කේ. සුමිත් සමීර ප්‍රනාන්දු සහෝදරතුමා**
ඉදිරිපත් කිරීම : ශු. ජුසේවාස් දේවධර්ම නිකේතනය,
කොළඹ 08.

# ඇදහිල්ලට අභියෝග

ඇදහිල්ලෙන් යුතුව සිටිමුව දවස පුරා
එයි අභියෝග නොසිතූ ලෙස අප කරා
යදිමින් බැතිබරව දෙවිඳුන් දිවිතුරා
සමිඳු අනුව පා නගමුව නිරතුරා

අවිශ්වාසය කරයි පලුදු ඇදහිල්ල
මිථ්‍යා ගුප්ත වදනේ ඇත රැවටිල්ල
පසුපස නොගොස් වෙන දෙවිවරු නැමදිල්ල
එකම දෙවිඳු වෙත දක්වමු ඇදහිල්ල

අසල්වැසියනට ප්‍රේමය දක්වන්න
රණ්ඩුදබර නොවී සාමය පතුරන්න
අවැසි අයට උපකාරය ඔබෙ දෙන්න
ලස්සණ ලොවක් මැවෙනව සිකුරුයි ඔන්න

ගැසුවොත් කෙනෙක් ඔබෙ කම්මුලට තදින්
හරවනු අනෙක් කම්මුල පාරක් කන රිසින්
ඔබ ගැන සේම අසල්වැසියා ගැන සිතමින්
උදේ සවස යැදුමෙන් සවි ලබනු නිතින්

වෙනස් වුවොත් ඇදහිල්ලෙන් මේ දිවියේ
කරදර විපත් එයි අප වෙත ලහි ලහියේ
උදේ සවස අදිමින් නළලත කුරුසේ
සවිමත් වෙමු නිතර කියමින් ජපමාලේ

දෙවි වදනින් ඔබේ සවන් පුරවාගන්න
කරුණාව සමඟ හොඳහිත සැමටම දෙන්න
කිතු සමිඳුන් අනුව ඔබ පා නගන්න
එවිට හැකිය සියලු අභියෝග ජය ගන්න

**ඩිලීෂියා තිලකරත්න**
වල්දෙනිය, කෑගල්ල.

# ඇදහිල්ලට අභියෝගයක් වූ මූලධර්මවාදය

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින්ම ස්ථාපිත කරන ලද, ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාදය සහ අති පරිශුද්ධ කන්‍යා මරිය මාතාවන් යන සුවිසල් කුලුනු ද්විත්වය මත ගොඩනගන ලද ශුද්ධ වූ සභාවේ ලිඛිත පදනම හා සිද්ධාන්තය දේව වචනය අඩංගු ශුද්ධවූ බයිබලයයි. මෙය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වන අතර පළමු වැන්න නම් 'පුරාණ ගිවිසුම' වන අතර දෙවැන්න 'නව ගිවිසුමය'. පුරාණ ගිවිසුම තුළ කිතු උපතට බොහෝ කලකට පෙර සිද්ධ වූ සංසිද්ධි හා ගැලවුම්කරුවකුගේ අනාගත පැමිණීම පිළිබඳවද සඳහන් ය. නව ගිවිසුම තුළ උන්වහන්සේගේ උපතත් සමග සිදු වූ සංසිද්ධි සහ උන්වහන්සේගේ ඉගැන්වීම් මෙන්ම බොරු චෝදනා එල්ල කර කුරුස ගසේ ඇණ ගසා මරා දමා තුන් දිනකට පසු නැවත සිදුවූ උත්ථාන පදනම් කරගෙන ලියැවුණු සිදුවීම් මාලාව හා කිතුනු අනුගාමිකයන්ගේ අත්දැකීම්ද අඩංගුව ඇත. කතෝලික සභාවේ සිද්ධාන්තද ගොඩනැගී ඇත්තේ, ශුද්ධ වූ බයිබලීය කරුණු මත පදනම්වය. එහෙත් අවාසනාවකට මේ මූලික හර විකෘත කරමින් යම් යම් අයගේ අවශ්‍යතා මත විවිධ වූ මුද්‍රණ ද බිහිවන්න ට ආරම්භවී ඇත. මෙසේ විවිධ වූ හේතු මත පදනම්ව විශ්වාසය මත ගොඩනැගුණු සාන්ත සභාවේ අවයව වන කිතුනු ජනයා තම ඇදහිල්ලට පිටුපා යමින් මෙලොවට පමණක් සීමා වූ, නිශ්චිත නිර්මාතෘ කෙනෙක් නොමැති, විවිධ මූල්‍ය අවශ්‍යතා මත ගොඩනගන ලද මූලධර්මවාදී සභා වෙත ගොස් තම ස්වර්ගීය දිවියට මෙන්ම හිමිකාරීත්වයට ද නැවතීමේ තිත තබා ගනිති. මෙය සුවිසල් මාතෘකාවක් වෙතත් මූලධර්මවාදී සභා කතෝලික විශ්වාසයට පහර එල්ල කරන මූලික කොටසක් සාකච්ඡාවට බඳුන් කරමි. එනම් "දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, කතෝලිකයා සහ මූලධර්මවාදීයා" අතර සහබන්ධනය හා ඔවුන්ගේ තාර්කික ද්වාර කිහිපයකි. ඒ පිළිබඳව විමසුමට ලක් කරමු.

පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් යම් තෝරා ගත් එක් මූලධර්මයක් හෝ මූලධර්ම කීපයක් තම විශ්වාසය ලෙස සලකා එය තම පරම සත්‍ය යැයි පදනම් කරගනිමින් වෙනත් මතවාද ගොඩනැගීම 'මූලධර්මවාදය' ලෙස සංක්ෂිප්තව දැක්විය හැකිය. සමහරුන් ශු. බයිබලීය පාඨ උපුටා දක්වමින් මූලධර්මවාදය සාධාරණීයකරණය කිරීමට පෙළඹී ඇත. නමුත්, ශු. මතෙව් ශුභාරංචියේ මෙසේ සඳහන්ය. "ඔබ කිසිවකු අතින් මුලා නොවන හැටියට වග බලා ගන්න. මන්ද බොහෝ දෙනෙක් ' මම ක්‍රිස්තුස් වෙමි' යි කියමින් මාගේ නාමයෙන් ඉදිරිපත් වී බොහෝ දෙනකු මුලා කරනු ඇත" (මතෙව් 24 :4). මෙය ක්‍රිස්තුස් වහන්සේම ප්‍රකාශ කර ඇත. එනම් මූලධර්මවාදය තුළ කියා පාන හාස්කම්, රෝග සුව කිරීම් යනාදිය බොරු දිවැසිවරුන් විසින් ම සිදු කරන බවයි. "බොහෝ බොරු දිවැසිවරු නැගිට බොහෝ දෙන මුලා කරන්නාහ" (මතෙව් 24 : 11). මෙය අද සමාජයේ වසංගතයක් බවට පත්ව හමාරය.

තමා දිවැසිවරයෙකියි කියා ගනිමින් මිනිසුන්ගේ මනසට විවිධ වූ අසත්‍ය තර්ක දමමින්, ඔවුන්ගේ සුබ විහරණය පමණක් සිතීම ඔවුන් සැමගේ ඒකායන බලාපොරොත්තුව බව පැහැදිලි ය. විවිධ ආකර්ෂණීය දේශනා රටා උපයෝගී කර ගනිමින්, විද්‍යාව හා තරංග අතර සම්බන්ධය මනා ලෙස සුසංයෝග කරමින්, විවිධ ආකර්ෂණීය චිත්ත රූප මිනිස් සන්දර්භයට යොමු කරවමින් කරන්නා වූ කූඨ මග පෙන්වීම ක්‍රිස්තුස් වහන්සේ වදාළ ලෙසම සිදු කරන්නේ දැයි සැක උපදින කරුණකි. විවිධ ස්ථානවල රෝගීන් සුව කරන අයුරු 'පාස්ටර්' යැයි කියා ගන්නා පිරිස කරන ආකාරය නෙත ගැටෙන විට මුවට සිනහවක් නැග පුදුමයක් යැයි සිතුණද, එය ස්ථිර වශයෙන් ම රැවටීමකි. අපගේ කුඩා රටෙහි විවිධ රෝගාබාධවලට ගොදුරු වූ ජන පිරිස් විශාල සංඛ්‍යාවක් වෙසෙන බව ලක් වැසියන් ලෙස අප කවුරුත් දන්නා කරුණකි. එසේ නම් ඔවුන් පවසන පරිදි "ජේසුස් වහන්සේගේ නාමයෙන්" රෝග සුව කරයි නම් ලංකාව පුරා රෝහල්වල ඔවුන්ට අනුව ඇත්තේ නිරෝගීන් ය. තීරණය ඔබේ අත මතය. ගැලවීම ලබා සදාතන ජීවිතයේ උරුමය ලබනුයේ අවසානය දක්වා ස්ථිරව සිටින්නාය. "එහෙත් අවසානය දක්වාම ස්ථිරව සිටින්නා ගැලවෙන්නේය" (මතෙව් 24:10).

කතෝලික සැමගේ අවසාන බලාපොරොත්තුව මරණින් පසු ස්වර්ගීය නිවහන කරා පිය නැගීමයි.

එයට අපගේ ස්ථිර විශ්වාසය ප්‍රධාන ලෙස බලපාන බවට නොරහසකි. අවසානය දක්වා ස්ථිරව සිටින්නට අදිටන් කරගෙන මෙලෝ දිවි රංගනය රඟ දක්වමු.

ශුද්ධවූ කතෝලික සභාවේ හිණිපෙත්ත හා කේන්ද්‍රස්ථානය හිමි වනුයේ, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේටයි. ඒ කේන්ද්‍රස්ථානයට මෙන්ම අග්‍රස්ථානයට මූලධර්මවාදීන් එල්ල කරන දුර්මත බොහෝය. ඒවා නම් පහත පරිදි පෙළගැස්විය හැක.

■ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු ශු. බයිබලයේ සඳහන් නොමැති කතෝලිකයින්ට පමණක් සීමා වූවකි.

■ මිදිරස හා පූපය ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පත්වන්නේද?

■ එසේ නම් කතෝලිකයන් මිනී මස් කන, රුධිරය පාන කරන කොටසක් ද?

■ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ නිත්‍ය වැඩ සිටීම.

මෙහි ප්‍රථම කරුණ පිළිබඳ සැලකීමේදී ප්‍රථමයෙන්ම සඳහන් කළ යුතු වන්නේ දිව්‍ය සත්ප්‍රසාදය කතෝලික සභාවේ නිර්මාණයක් නොව එය ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුස්වහන්සේ විසින්ම දායාද කරන ලද උතුම් තිළිණයක් බවයි. දිව්‍ය සත්ප්‍රසාද සක්‍රමේන්තු ආකාරයෙන් ස්ථාපිත කරන ලද්දේ, රදගුරුවරයෙක්, පූජකයෙක් හෝ ගිහියෙක් නොව සමදර්ශක ශුභාරංචි වල සඳහන් ආකාරයෙන් අන්තිම රාත්‍රී භෝජනය දින ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින්මය. මෙය එදිනට පමණක් සීමා වූ භෝජනයක් නොවේ. "ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගීකමෙහිද, රොටී කැඩීමෙහිද, යාච්ඤාවෙහිද නිරතව කල් ගත කළහ" (ක්‍රියා 2:42). තවද මෙය අපෝස්තලික සම්ප්‍රදාය තුළින් පරපුරෙන් පරපුරට භාර කරන ලද සම්ප්‍රදායක් බවට සිහි කළ යුතුමය.

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියූ පළමු හසුනෙහි සඳහන් පරිදි ශු. ලියවිල්ල තුළ ක්‍රිස්තුස්වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ඉතිහාසයේ සත්‍ය වශයෙන්ම සිදු වූ සත්ප්‍රසාදීය පිළිවෙත කතෝලික සභාවට පමණක් නොව සැම කිතුනු අනුගාමිකයකුම අනුගමනය කළ යුතු සහභාගීශීලී පිළිවෙතකි. "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි, ඔබ මනුෂ්‍යය පුත්‍රයාණන් ගේ මාංසය අනුභව නොකරන්නහු නම්, ඔහුගේ රුධිරය පානය නොකරන්නහු නම්, ඔබ තුළ ජීවනය නැත" (ජොහාන් 6:53). එමෙන්ම එය නොපිළිගන්නන් හට සදාතන දිවියේ අරුමය විඳුමට නොහැකි බවද පෙන්වා දෙන්නේ ද ක්‍රිස්තුස් වහන්සේය. කතෝලික ප්‍රජාවට මෙන්ම බොහෝ ජනයාට ඇති ප්‍රධාන ගැටලුවක්ව ඇත්තේ, මිදිරස හා පූපය ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය වනවාද යන්නය. මෙය මූලධර්මවාදීන්ට පමණක් සීමා නොවූවකි. එය ජුදා ජාතික භක්තිකයන්ට ද පොදු වූ ගැටලුවකි. එය දේව වචනය තුළ ද අඩංගුය. "මේ මිනිසා ඔහුගේ මාංසය අනුභව කරන පිණිස අපට දෙන්නේ කෙසේ දැයි කීහ" (ජොහාන් 6:52). එසේ නම් කතෝලිකයින් මිනී මස් කන පිරිසක් ද? එයට ජොහාන් සුබාරංචියේ 6:52-56 කොටසින් අපූර්ව ලෙස විග්‍රහ කර දක්වයි. එයට අනුව දිව්‍ය සත්ප්‍රසාද බොදුන සදාතන දිවියට මඟ පාදන දිව්‍ය ඔසුවකි. මෙහිදී පූප හා මිදිරස බාහිර ස්වරූපය එලෙස පැවතියද එහි අභ්‍යන්තර ස්වරූපය වෙනස් වේ. ජුදෙව්වන් එදා එය ලෞකික ආහාරයක් ලෙස හඳුනා ගත්තද එය ලෞකිකත්වයෙන් ඔබ්බට ගිය ජීවනදායක බොදුනකි. මෙය මිනිසාගේ අධ්‍යාත්මයට ලබා දෙන දිව්‍යමය ආහාරයක් මිස මාංසයට දෙන භෝජනයක් නොවේ. "මේ වනාහි ස්වර්ගයෙන් පහළ වූ ආහාරය වේ" (ජොහාන් 6:58). එය අප සැම තරයේ මතක තබා ගත යුතු කරුණකි.

කතෝලික ප්‍රජාව ලෙස අප දේව වන්දනාවේ අග්‍රස්ථානය හා කේන්ද්‍රස්ථානය වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නිසි ගෞරවය දක්වනවාද යන්න ඇසිය යුතුම ප්‍රශ්නයකි. අන්‍යාගමිකයන් හා මූලධර්මවාදීන් දිව්‍ය සත්ප්‍රසාද කෙරේ දක්වන අවිශ්වාසය නිසා ඔවුන් දිව්‍ය සත්ප්‍රසාදයට ගෞරව දක්වන්නේ නැත. එහෙත් කතෝලිකයන් ලෙස සත්ප්‍රසාද වහන්සේව දැඩිව විශ්වාස කරන අප උන්වහන්සේට හිමි නිසි ගෞරවය පුදකරනවාද? "එහෙයින් නුසුදුසු ලෙස සමිඳාණන් වහන්සේගේ මේ රොටී වළඳන මේ කුසලානයෙන් පානය කරන කවරෙක් වුවද. එසේ වැළඳීමෙන් හා පානය කිරීමෙන් සමිඳාණන් වහන්සේගේ ශරීරයට හා රුධිරයට විරුද්ධව පව්

25 වන පිටුවට.....

**බුද්ධික සඳරුවන් සිල්වා**
13 - ගණිත අංශය
ශා. මරියා විදුහල - මීගමුව

කලාපයෙන් කලාපයට
භක්තියෙන් ප්‍රබෝධනයට ලියන

# චුට්ටා

## චූටිකමට කියන කතා....

නොදන්න දොස්තර කෙනෙක් ලඟට ගිහින් බෙහෙත් ගත්තෙ අපේ අම්මා මා එක්ක ගිහින්මයි. දොස්තර දුන්න බෙහෙත් තුන්ඩුව අල්ලපු ෆාමසියට ගෙනිහින් බෙහෙත් ගෙනාවේ මං. මට ඒ ෆාමසියේ බෙහෙත් දුන්නෙ පොඩි අක්කා කෙනෙක්. කාරණා මෙහෙම තිබුණට අපේ අම්මා මාත්‍රාවට පිළිවෙලටම බෙහෙත් ටික බිව්වයි කියමුකො. එතකොට මං අහන්නෙ අපේ අම්මගෙන් "අම්ම දන්නවද ඒ දොස්තර M.B.B.S. සහතිකයක් අරගෙන තියෙනවද අර ෆාමසියෙ ඉන්න පුංචි පොඩි අක්ක ඒ බෙහෙත් හරියට දුන්න කියලා" මං ඇහුවා. අම්මා කියපි "මට විශ්වාසයි බං" කියලා. ඒ කියන්නෙ නොදැනත් විශ්වාස කරනවා. ඒකනම් හරියටම අභියෝගයක් තමයි. ඒ තමයි ජීවිතේ. මට මතකයි අපේ මාමා දවසක් කියනවා. "අපි කඩයකින් කෑමක් ගත්තත්, බස් එකක ගමනක් ගියත් අපි හරියට දැනගෙන නෙවෙයි ඒක කරන්නේ කියලා" ඇත්ත තමයි බලං යනකොට කතාව. අපි දන්නේම නැතුව සාමාන්‍ය ජීවිතයේ හැම දෙයක්ම විශ්වාසය මත රැඳිල තියෙන්නෙ කියලා හිතෙනවා.

මෙහෙම බලනකොට කොයි දෙයක් උනත් නොදැන, නොදැක, නොඅසා අපි විශ්වාස කරනව නේද කියලා මට සිතුණේය. ඉතින් එහෙනම් අපි ඇසුවට, දැනගත්තට, ඒත් නොදැක්ක දෙවියන්ව කොයි තරම් විශ්වාස කරන්න ඕනද නේද? මගේ මේ පුංචිම පුංචි මොළේට දවසක් සිතුණේය. මනුස්ස ලෝකේ අපි හුඟ දේවල් කොච්චර විශ්වාස කරනව ද? එහෙව් එකේ දේව ලෝකයේ දේවල් අපි විශ්වාස කරන්නම ඕන නේද කියලත් සමහර විට පුංචි මට සිතෙන වාර අනන්තයි.

විශ්වාසය කියන්නේ අභියෝගයක් කියලා එදා දේශනාවාදී පියතුමා අපේ ගමේ මංගල්‍ය නොවානෙදී කිව්වට මට හරියට නම් තේරුණේ නෑ. ඒත් ගෙදර ඇවිත් අම්මා එක්ක එදා බෙහෙත් ගන්න ගිය වෙලේ තේරුණා එදා ෆාමසියෙ හිටපු පොඩි අක්කා දුන්නෙ වැරදි බෙහෙතක් නම් අද මම අම්මෙ කියන්නෙ කාටද? ඒ වගේම එදා කොළඹ කියල ලියලා බෝඩ් එක ගහල තිබුණ බස් එක හලාවත ගියානම් අපිට මොනව වෙන්න තිබුණද? ඒ ඩ්‍රයිවර් මාමා කොළඹට අපිව අරන් යන ගමන් අපි දෙන්නම නිදාගෙනයි හිටියෙ. අපේ අම්ම නිකමටවත් ඩ්‍රයිවර් මාමගේ රියදුරු බලපත්‍රය ගැන ප්‍රශ්නකළේ නැනෙ නිකමටවත් අම්ම හිතන්න ඇති එයාට රියදුරු බලපත්‍රයක් තියනවා කියලා. ඒක තමයි විශ්වාසය. තර්ක කරලා, ඔප්පු කරලා, ප්‍රශ්න කරලා හොයලා බලනවට වඩා සරලව හිතුව ඒ හැම දෙයක්ම හරියි කියලා. ඔන්න විශ්වාසය. ඉතින්, අපේ සීයා සහ ආච්චි දවසක් කියනවා මං අහගෙන, "ඔන්න ඔය පරමණ්ඩලය නමෝ මරිය දන්නව නම් ස්වර්ගයට යන්න උණත් බැරි කමක් නෑ" කියලා. එතකොට අපේ කැම්පස් අක්කා කිව්වා "ඒක ඇත්ත. ඔය දේව ධර්ම ශාස්ත්‍රය ගැඹුරින් හැදැරුවේ නැතුව ගියාට, ලොකු ලොකු පොත් ගෙඩි නොකිව්වට අපේ සීයලා ගෙ තාත්තල පවා සරල විශ්වාසෙන් ගොඩ ගිය අයලු" කියා කොන්තෙ අතට ගත්තාය. මෙහෙම බලනකොට අභිරහස් වගේ දේවල් ගැන මොනවට තර්ක කරන්න යනවද කියලා මට හිතුණේ අපේ මාමා නිතරම අපි හවස යාච්ඤා කරනකොට හිනා වෙනවා දකිද්දී ය. දවසක් අපේ සීයා නියම කතාවක් කීවේය. " බොලං කොල්ලනේ, උඹ දෙවියන්ට හිනාව උණාට තාම දෙයියො උඹට හිනා වෙන්න පටන් ගත්තෙ නෑ කියාය. දෙයියො හොඳ හින්දා උඹ හොඳින් ඉන්නව කියලා" සීයා කීවේ තොල හපාගෙනමය.

ඉතින් අපි හැමෝටම මේ කතාව නම් තේරුම් ගන්න පුළුවනි. "විද්‍යාව තාක්ෂණය අතින් ලෝකය දියුණු උණාට අපි දියුණු වෙලා නෑ" කියලා දවසක් අපේ බාප්පා කෙනෙක් කීවේය. ඉතින් එහෙම තමා අපි කවද්ද දියුණු වෙන්නෙ කියලා මගේ නොතේරුම් කමට ඇසුවෙමි. අපේ අම්මා කීවේ, "ඇත්තටම ඒක වෙන්නෙ ඒ අභියෝගයට අපි හරියට මූණ දෙන දාට. ඒ කියන්නේ තර්ක නැතුව දෙවියන්ව හදවතින් හඳුනාගෙන අපි උස් මිනිසුන් උනාම" කියලා අම්මා ගස්සාගෙන අපේ තාත්තා දෙස රවාගෙන ගෙයි ඇතුළට ගියාය. කතාව තේරුම් ගත්ත අපි නිහඬවම හිතින් නමෝ මරියක් කියා ගත්තෝය.

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා**
බංගලාදේශයේ සිට

# අගයමු මිනිසත් බව



මිනිසත් බවකින් සරසමු දහමින්
එක්වී බැඳෙමින් සොයුරු ප්‍රේමෙන්
යහපත ඉවසීම කරුණා ළයාදරෙන්
අගයමු මිනිස් බව සැමගේ හදින්

සතුවේනම් මා සතු උදාර යහපත
දියත් කරමු ලෝ දියුණුවෙ මාවත
සත්‍යය පියවර අතුරා ලෝ සැමසත
අගයමු මිනිස් බව මිහිමත

මංමුලා වූ මරුවැල් නසමින් දස අත
වපුරා සිත් තුළ ගුණදම් සුව සෙත
නතුකර හැම දිනහට උරුමයේ සම්පත
අගයමු මිනිස් බව මිහිමත

කාසියෙ බලයේ නොරැඳී හැමවිට
කරුණා දයාවේ පුරවා හද හැමවිට
මිතුරන් විලසින් එකමුතුවී රැඳෙනට
අගයමු මිනිස් බව මිහිපිට

ධනයෙන් බලයෙන් නොතලා සැමසිත
එකා වගේ නැඟිටින්නට අත දෙමු මිහිමත
සැමදා සැමතැන පුදකර නොදකින
අගයමු මිනිස් බව මෙදින

**ලිලී ඇග්නස් සියඹලාපිටිය**
කටුවපිටිය

ඇදහිල්ලට... 23 වන පිටුවෙන්...

කිරීමේ වරදකරුවෙක් වන්නේ ය” (1 කොරින්ති 11:27). මේ නුසුදුසු ආකාරයෙන් වැළඳීම ප්‍රධාන ආකාර දෙකකට බෙදා දැක්විය හැකිය.

- ආත්මික සූදානම
- ශාරීරික සූදානම

අප මනුෂ්‍යයන් ලෙස වැදගත් පුද්ගලයකු ඉදිරියට යන විට අපිරිසිදු ලෙස කෙදිනකවත් නොයන බව නොරහසකි. නමුත් සුදු සාරිය ඇඳ, සුදු චේලය පැළඳ ගරාදි වැටට එන ඔබේ හදවත කෙතරම් පිරිසිඳුද? මෙය ඔබෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයකි. ශාරීරිකව කෙතරම් අප සුන්දර වුවද, ජේසුස් වහන්සේවම අප හද තුළට ලබා ගන්නා විටදී අප හදවත් කෙසේ පිරිසිදු විය යුතුද? දිව්‍ය පූජාවට පෙර පැමිණ තම අඩුපාඩුවලට මනස්තාප වීම, පාපෝච්චාරණය කර ගැනීම අද බොහෝ දෙනාට අමතක වී ඇත මේවා අපගේ ඇදහිල්ලට සාතන්ගෙන් එල්ල වන ප්‍රහාරයි. බොහෝ මූලධර්මවාදී සභා සත්ප්‍රසාදීය ජේසුට දක්වන අගෞරවය කෙතරම් ද යත්. පූපය වෙනුවට පාන් හෝ රොටී ගෙන මිදිරස වෙනුවට ‘නෙක්ටෝ’ පැණි බීම ගෙන අන්තිම රාත්‍රී භෝජන පිළිවෙත සිදු කිරීම කෙතරම් ශෝක ජනකද? ශු. පූදසුන මත පමණක් සිදුවන මෙම ප්‍රාතිහාර්යය වර්තමාන මූලධර්මවාදී සභා නිවාස තුළ ද සිදු කිරීම ආරම්භ කර ඇත. කෙසේ නමුත් කතෝලික විශ්වාසයට තාඩන පීඩන හා ගැරහුම් එල්ල වන මෙවන් යුගයක එය රැක ගැනීමේ කර්තව්‍යය කතෝලික ඔබට මට පැවරී ඇත. සාතන්ගේ මේ පාපී ක්‍රියාවලට තිත තබන්නට ජපමාලය අතට ගෙන පෙරට පැමිණ සභාවේ අනාගතය සුරැකීමට ඇප කැප වෙමු.

අනාගත දරු පරපුරේ සභාවේ අනාගතය හා දිව්‍ය සත්ප්‍රසාදීය බලය තුළ අනාගත සභාවක් හා තිර විශ්වාසීය ජීවිතයක් ඉදිරි පරපුරට දායාද කරන්නට අවැසි මැදිහත් මවු පිහිට මරිය මවුන්ගෙන් පතමු. අප සැම එක්ව ඇදහිල්ලට අභියෝගයක් වූ මූලධර්මවාදයට අභියෝගයක් වන්නට පෙළ ගැසෙමු.

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය





ආදර දුවේ පුතේ,

මේ දිනවල නිතරම අහන්නට දකින්නට ලැබෙන ශෝචනීය සිදුවීමක් තමයි ඊශ්‍රායෙල්, පලස්තීන යුදමය තත්ත්වය. මේ යුද්ධය නිසා මේ වන විට පන්දහසකට අධික ප්‍රමාණයක් දරුවන්ගේ ජීවිත විනාශ වෙලා තියෙනවා. ආබාධිත වූ, මව්පියන් අහිමිව අසරණ වූ දරුවන් සංඛ්‍යාව කොතෙක් දැයි කිව නොහැකි තරම්. කුමන හේතුවක් මත, කාට එරෙහිව සිදු කළත් යුද්ධයක් කියන්නෙ කොහොමටවත් හොඳ දෙයක් නෙවෙයි. මනුෂ්‍ය ජීවිත අහිමි කරන, ආබාධිතයන්, අනාථයන් ලොවට ඉතිරි කරන, දරුවන්ට ඉතාම දුක්ඛිත ජීවිතයක් උරුම කර දෙන කුමන ආකාරයේ ගැටුමකට වුණත් අපි එරෙහි වෙන්න ඕන. ගාසා තීරයේ යුද ගිනිදැල් මැදින් මා දුටු පුංචි වීරයෙක් ගැනයි මේ කතාව. බෝම්බ ප්‍රහාරයකට ලක් වූ පෙදෙසක සිට දුව ආ බවට සලකුණු ඇති පුංචි පුතෙක්. එයා තමන්ගෙ නංගිව තදින් අතින් අල්ලගෙන හිටියා. දෙදෙනාම දූහුවිල්ලෙන් නැහැවිලා. ඇඳුම් කිලිටි වෙලා. ලේ ගෑවිලා. අවුරුදු තුනක් පමණ වයස ඇති පුංචි දැරිය 'අම්මා' කියමින් ඉකි ගසමින් හඬනවා. මේ අතර වීඩියෝ කරමින් ඉන්න පුද්ගලයාට පුංචි පුතා කෑ ගහල මෙහෙම කියනවා.


"අර ඉන්නෙ මගේ සහෝදරයා... අනේ මට එයාව ගෙනත් දෙන්න". ඔහු නොනවත්වාම අත දිගු කරමින් කෑ ගසනවා. මේ දසුන කැමරා කරන පුද්ගලයා දුව ගොස් කුඩා පිරිමි දරුවකු අතින් අල්ලාගෙන ඔහු වෙත රැගෙන එනවා. අයියා නිදහස් අතින් ඒ මල්ලීවත් තදින් අල්ලා ගන්නවා. දැන් මේ අයියගෙ එක් අතක පුංචි නංගී. අනික් අතේ පුංචි මල්ලි. ඒ දෙදෙනාම අම්මා ඉල්ලමින් අඬනවා. භයානක යුද්ධයක් මැද්දෙ තමන්ගෙ සහෝදරයන්ව රැක ගන්න වෙර දරන ඒ අවුරුදු හත අටක පුංචි පුතා මට නම් මහා වීරයෙක්. තවත් අවස්ථාවක මා දකිනවා ගාසාහි අල්ෂිෆා රෝහල ඉදිරිපිට පලස්තීන දරුවන් පිරිසක් මාධ්‍ය ඉදිරියේ අදහස් දක්වනවා. ඔවුන් ලෝකයට කියන කතාව මේකයි, ''අපට ජීවත් වෙන්න ඕන. අපට සාමයෙන් ජීවත්වෙන්න ඕන. ආහාර, බෙහෙත්, අධ්‍යාපනය ඕනෙ. අපටත් අවශ්‍යයි අනිත් දරුවන් වගේ ජීවත් වෙන්න.'' භයානක යුද්ධයක් මැද දරුවන්ගේ ජීවිත රැක දෙන්නයි මාධ්‍ය ඉදිරියේ නොබියව අදහස් දක්වන මේ දරුවන් විරුවන් නොවේද?

මේ අතර මා දකිනවා සෝමාලියාවේ දරුවන් විශාල පිරිසක් පලස්තීනයේ දරුවන්ගේ ජීවිත රැක දෙන්නයැයි ලෝකයට ආයාචනය කරමින් විශාල පෙළපාළියක් යනවා. ලෝකයේ කොහේ කොතැනක වුණත් දරුවන්ට එරෙහිව සිදුවන අපරාධයකදී ඔවුන් වෙනුවෙන් පෙනී සිටින කවුරු වුණත් වීරයන් නේද ?

ආදර දුවේ පුතේ, සමහරවිට ඔබ මේ යුද්දය ගැන කිසිදු තොරතුරක් නොදන්නවාත් ඇති. එය ඔබේ වරදක් නොවේ. නමුත් අමතක කරන්න එපා අපි සතුටින් නත්තල සමරන්න සූදානම් වන මේ මොහොතේත් ලොව කොතැනක හෝ ඔබ වැනිම දරුවකු යුද්ධය නිසා අසරණ වී ඇති බව. ජීවිතය ඉල්ලා හඬා වැටෙන බව. ජීවත් වෙන්න නිවසක්, ඉගෙනගන්න පාසලක්, බෙහෙත් ටිකක් ගන්න රෝහලක් සමහරවිට ආදරය කරන්න කිසිම කෙනකු නැතිව තැනින් තැනට පලා යමින් සිටින බව. මේ ලෝකයට අවශ්‍ය ආදරයයි. සාමයයි. පුංචි ඔයාලට විතරක් නෙවෙයි, වැඩිහිටියන්ට, සොබාදහමට පවා අවශ්‍ය නිදහසේ ජීවත් වෙන්න. සාමයෙන්, සතුටින් ජීවත් වෙන්න. ඒ නිසා යුද්ධයට හෝ ඕනෑම ගැටුමකට සිතුවිල්ලකින්, වදනකින් හෝ ක්‍රියාවෙන් අනුබල නොදෙන හැම කෙනෙක්ම වීරයෙක් බව අමතක කරන්න එපා. ඔයාල හැමදෙනාටම ආදරය, සතුට සහ ධෛර්යය පිරුණු සුබ නත්තලකට, සුබ නව වසරකට ආසිරි !

තරු නැන්දා (තරංගනි රෙසිකා)

## ප්‍රහේලිකා අංක - 77



**පහළට**

1. දකුණු අප්‍රිකාවේ බටහිර වෙරළ තීරයේ පිහිටි රටකි.
2. "කැළැල්"
3. "ස්ථිර නොවන" යන්නට සමාන වචනයකි.
4. පුද්ගලයකුගේ අනන්‍යතාව ඔප්පු කරන ප්‍රධානතම වචනයකි.
6. මිනිසුන්ගේ දැනගැනීම සඳහා මේවා නිකුත් කරනු ලැබේ.
8. කතරගම පුදබිම හා බැඳුණු නර්තන විශේෂයකි.
10. සර්පයන් විසින් ඉවතලන දෑ.
11. සෛලයක ප්‍රෝටීන සංස්ලේෂණය සිදුවන මධ්‍යස්ථානය.
13. හෝමාගම ප්‍රදේශයේ කර්මාන්තපුරය පිහිටි නගරය.
16. කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකි.
17. ඕමානයේ අගනුවර
20. "තේරුම"
21. ප්‍රාණ පරිත්‍යාගවරුන් ඇදහිල්ල වෙනුවෙන් පරිත්‍යාග කළේ.
22. අල්ලස්
23. ඇමරිකාවේ පිහිටි ජාතික අවකාශ තරණ සහ අජටාකාශ පරිපාලන ආයතනයේ කෙටි නම.
24. ඕනෑම බොන ද්‍රව්‍යයක් මේ නමින් හැඳින්වේ.
25. බිලී බෑමේදී මාළුන් අල්ලා ගැනීමට මෙය යොදා ගනී.

**හරහට**

1. කිතුනු ජීවිතයේ අත්‍යවශ්‍යම අංගයකි.
3. ඇදහිල්ල වනාහි....... දේ පිළිබඳ සහතිකය වේ (හෙබ්‍රෙව් 11:3).
5. "පනී" යන්නෙහි බහු වචන ක්‍රියා පදයයි.
7. නැගෙනහිර ශ්‍රී ලංකා මුහුදු තීරයේ මේ වරාය අතීතයේදී මේ නමින් හැඳින්විණි.
9. මෝටර් රථ දෙපාර්තමේන්තුව පිහිටියේ.
12. ගිනිකන්දක් පිපිරීමෙන් පිටවන ද්‍රව්‍යයකි.
13.කත්කාරයා විසින් ඔසවා ගෙන යනු ලබන්නේ.
14. මිදි යුෂෙන් තනා ගන්නා පානයකි.
15. තෙලිඟු රටෙන් ලැබුණු අප පෙරහැරවල දැකිය හැකි නර්තන විශේෂයකි.
17. දුටු ගැමුණු රජතුමා ළඟ සිටි ඇතුන් දහසකගේ ශක්තිය ඇති ප්‍රධාන යක්ෂ සෙන්පතියා.
18. පැරණි අධිකරණ සභාවකි.
19. මුහුණ, මුඛය යන දෙකටම සමාන අරුත් දේ.
20. "අවාරය" යන අරුත් දේ.
22. හිස පීරීමට යොදා ගැනේ.
24. ලෙබනනයේ අගනුවර.
25. වඩු කර්මාන්තයේ වස්තූන් දෙකක් සම්බන්ධ කිරීමට යොදා ගන්නා ලෝහමය වස්තුව.
26. පලස්තීනය හා ඊශ්‍රායෙලය අතර යුද ගැටුම් ඇතිවන බිම් තීරය.
27. ගොයම් පෑගීම සිදු කරන ස්ථානය.
28. "ඇදහිල්ල, බලාපොරොත්තුව හා ....... සදහටම පවතින ධර්මතා තුනකි. මෙයින් ශ්‍රේෂ්ඨතම වනුයේ ...... ය" (කොරින්ති 13:13).

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා**

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2024 පෙබරවාරි 30 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. *විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.*

ප්‍රහේලිකා අංක - 77
"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර,
මරදාන, කොළඹ 10.

## ප්‍රහේලිකා අංක 75 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ප්‍ර | 2 ඥා | ව | | 3 කා | ය | 4 ශ | 5 ක් | 6 ති | ය |
| 7 ග | න | | 8 ජ | | | 9 ක් | ෂ | ණ | |
| 10 ම | ය | 11 ලි | න් | | 12 ස | ති | ය | | 13 හැ |
| න | | 14 ස් | ම | 15 ර | ණ | ය | | 16 අ | ට |
| 17 ය | ක් | ස | | ට | | | 18 ආ | ග | න් |
| | | 19 න | 20 හ | ය | | 21 ධ | ජ | ය | |
| 22 මි | | 23 ග | ත | කු | රු | | න් | | 24 ගු |
| බා | | 25 ස | ර | මි | | 26 මැ | ට | | ණ |
| 27 යෙ | න් | | පේ | | | 28 ලේ | නා | | ක |
| ල් | | 29 ආ | රු | ක් | කු | | 30 ව | ළ | ඳ |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 75 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 75 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් එක්කෙනකු පමණක් ජයග්‍රහණය කර ඇත. සහභාගි වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභීන්ට ඔබේ ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ඔබට ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - ෂෙහාරා අංජලී පෙරේරා - 9 වසර, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, පානදුර.
- **දෙවන ස්ථානය** - *(කිසිවකු ජයග්‍රහණය කර නොමැත)*
- **තෙවන ස්ථානය** - *(කිසිවකු ජයග්‍රහණය කර නොමැත)*

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2024 මාර්තු / අප්‍රේල් - "දේව වන්දනා ජීවිතය"**
(මාර්තු - අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි ජනවාරි 15 ට පෙර අප වෙත එවන්න.)
**2024 මැයි / ජුනි - "පල්ලියේ මංගල්‍යය"**
(මැයි - ජුනි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## අ. පො. ස. (සා/පෙළ) විභාගය - 2023
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස

■ ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.

01)
i. දිව්‍ය පූජාවේ දක්නට ලැබෙන මුලසුනේ යැදුම් දෙකක් ලියන්න.
ii. පූජකවරය දානය කිරීමේ පිළිවෙත තුළ දැකිය හැකි ප්‍රධාන අංග දෙකක් ලියන්න.
iii. ආශීර්වාදකාර බන්ධනය දානය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
iv. පැවිදි නිකායන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.
v. මරිය හමුදාව ආරම්භ කළේ කවුද?
vi. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේදී සියලු දෙනා විනිශ්චයට ලක් කරන මිනුම් දණ්ඩ කුමක්ද?
vii. ශුද්ධ වූ සභා විනය හා සෙසු කාරණ පිළිබඳ නීති ඇතුළත් වන්නේ කුමක් තුළද?
viii. ගොඩමස් කෑමෙන් වැළකී සිටිය යුතු දින දෙකක් ලියන්න.
ix. පරමණ්ඩල යාච්ඤාව අඩංගු වන සුබාරංචි දෙකක් ලියන්න.
x. ස්වර්ගාරෝහණය විය හැකි වූ එකම තැනැත්තා කවුද?

02)
i. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ආදර්ශ පාඨය කුමක්ද?
ii. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රමවේදයෙහි පියවර තුන නම් කරන්න.
iii. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ අනු පරමාර්ථ පහක් නම් කරන්න.

03)
i. විවාහය දේව ප්‍රසාද නිධානයක් බවට පත් වීමට අවශ්‍ය කරුණු දෙකක් ලියන්න.
ii. එපීස 5:31-33 ට අනුව පුරුෂයාට හා භාර්යාවට ලැබෙන පණිවිඩ තුනක් ලියන්න.
iii. කතෝලික විවාහ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා තිබිය යුතු ගුණාංග පහක් ලියන්න.

04)
i. දරුවන්ට හා දෙමව්පියන්ට අවවාද කර ලිපියක් ලියන්නේ කවුද?
ii. ඒ ලිපියේ නම කුමක්ද?
iii. දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ දෙමාපියන් සතු වගකීම් තුනක් ලියන්න.

05)
i. දෙවියන් වහන්සේගේ නාමය ගෞරවයෙන් යුතුව භාවිත කළ යුතු බව අපට පෙන්වා දෙන්නේ කුමන පණතින්ද?
ii. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පව් තුනක් ලියන්න.
iii. දෙවන දේව පණතට විරුද්ධ ක්‍රියා පහක් ලියන්න.

## පිළිතුරු

01)

i. පොදු යැදුම/ පඬුරු මත යැදුම/ බොදුනෙන් පසු යැදුම

ii. අපේක්ෂකයාගේ හිස මත අත් තබා නියමිත වචන උච්චාරණය කරමින් මේ දේව ප්‍රසාද නිධානය දානය කිරීම.

iii. විවාහ වන යුවල එකිනෙකාට

iv. පැවිදි පූජක හා පූජක නොවන පැවිදි අය

v. ෆ්‍රැන්ක් ඩෆ් මහතා

vi. පුණ්‍ය ක්‍රියා

vii. සභා නීති සංග්‍රහය

viii. අළු බදාදා/ මහ සිකුරාදා/ අවුරුද්දේ සෑම සිකුරාදාටම

ix. ලූක් හා මතෙව් සුබාරංචිවල

x. ජේසුස් වහන්සේ

02)

i. "අපි විප්ලව නොකරමු. විප්ලවය අපි වෙමු".

ii. බැලීම/ විග්‍රහය/ ක්‍රියාව

iii. මිනිස් වටිනාකම් ගොඩනැගීම/ ආකල්ප සංකල්ප විකල්ප බිහිකිරීම/ සැබෑ සේවක නායකත්වයක් බිහි කිරීම/ දක්ෂතා හා කුසලතා පුහුණුව හා වර්ධනය

03)

i. ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනකු අතර විවාහය සිදුවීම./ දේවස්ථානයක කතෝලික ආගමික පූජකවරයකු ඉදිරියේ විවාහය සිදු වීම.

ii. මිනිසෙක් තම මවද පියාද අතහැර සිය භාර්යාවට ඇලුම් වන බව/ හැම පුරුෂයෙක්ම තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කළයුතු බව/ හැම භාර්යාවක්ම තම ස්වාමි පුරුෂයාට ගෞරවය දැක්විය යුතු බව.

iii. දෙදෙනාම කතෝලික වීම/ අන්‍යෝන්‍ය විශ්වාසය හා ප්‍රේමය/ පිරිසිදු චරිතය/ අවබෝධය හා තේරුම් ගැනීම/ පරිත්‍යාගය.

04)

i. ශුද්ධවූ පාවුලු තුමා

ii. එපීස ලිපිය

iii. සදාචාර අධ්‍යාපනය/ ආධ්‍යාත්මික ගුණ වගාව/ ධර්මදානය/ නිවැරදි කිරීම/ යාච්ඤා කිරීමට ඉගැන්වීම/ පාසල් අධ්‍යාපනය.

05)

i. දෙවන පණත

ii. දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම/ දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම/ දිව්‍යමය වූ යහපතින් කෙනකුව වළක්වාලීම/ උඩඟුවෙන් දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කිරීම.

iii. සිසු අදහස්

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# විශ්ව සභා ඉතිහාසය XV
## අ. පො. ස. (උ. පෙ.) ක්‍රිස්තියානි ධර්මය/ ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්
## ක්‍රි. ව. 4 - 16 දක්වා සියවස්

### නව ගිවිසුම බිහිවීම I

නව ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී එයට අයත් පොත් සංඛ්‍යාව 27 කි. ඒ පොත් සියල්ල රචනා වී ඇත්තේ ග්‍රීක බසිනි. සුබාරංචි ලෙස පොත් 4 කි. (මතෙව්, මාක්, ලූක්, ජොහාන්) ප්‍රේරිතවරුන්ගේ ක්‍රියා පොත යුගයේ ආරම්භය පෙන්වා දේ. පාවුලු තුමන්ගේ යැදුම් පත්‍ර 13 කි. සාමාන්‍ය හසුන් හෙවත් ලේඛන 8 කි. ජොහාන් තුමාට එළිදරවු වූ දර්ශනය එක් පොතකි.

### නව ගිවිසුම් පසුබිම

ඒ පසුබිම ආරම්භය ක්‍රිස්තු පූර්ව 333 තරම් ඈතක සිට ආරම්භ වේ. පර්සියානු අධිරාජ්‍යය පෙරළා දමා ග්‍රීක අධිරාජයා වූ මහ ඇලෙක්සැන්ඩර් ක්‍රි. පූ. 333 දී බලය අත්පත් කර ගනී. පලස්තීනය ද ඔහුගේ රාජ්‍ය පාලනයට ලක් විය. එහෙත් වසර 10 කින් පමණ ක්‍රි. පූ. 323 දී මහ ඇලෙක්සැන්ඩර්ගේ අභාවයෙන් පසුව අධිරාජ්‍යය කොටස් 4 කට වෙන් වී පරිපාලනය විමධ්‍ය ගත විය. මිසරය අයත් වූයේ ටොලමි සෙන්පතියාට ය. අන්තිපාතෙර් සෙනෙවියාට මැසිදෝනිය සහ ග්‍රීසිය අයත් විය. ලිමාකුස් ත්‍රාසයත් සෙලෙවිකස් බැබිලෝනියාවත් අත්පත් කරගෙන පරිපාලනයේ යෙදුණි. ක්‍රි. පූ. 313 දී ටොලමිවරුන් යටතට ජෙරුසලම පත්විය. 2 වන ටොලමි ක්‍රි. පූ. 285 පමණ දී හේබ්‍රෙව් ශුද්ධ ලියවිල්ල ග්‍රීක් බසට පරිවර්ථනය කළේ ය. ඒ පිටපත සැත්තෑ දෙදෙනකුගේ පිටපත (72) හෙවත් සේප්ටුවාජින්තය ලෙස හැඳින්වේ. ක්‍රි. පූ. 203 දී ටොලමිවරුන්ගේ බලය ගිලිහී ඒ වෙනුවට ඇන්ටිසෝක් පරපුරේ රජවරුන් විසින් ජෙරුසලම අත්පත් කර ගන්නා ලදී. ක්‍රි. පූ. 175 සිට බලවත් වූ සිව්වන ඇන්ටිසොකස් එපිහනස් රජු හෙලනිස්තකරණය හෙවත් ග්‍රීක සංස්කෘතිය සහා ආගම් බලාත්කාරයෙන් ජුදාවරුන් වෙත පැටවී ය. හෙලනිස්තකරණයට විරුද්ධ වූ ජුදාවරු ඇන්ටිසොකස් එපිහනස් සමඟ කැරැල්ලකට පිවිසුණහ. ඒ තත්ත්වය මකබි කැරැල්ල ලෙස හැඳින්වේ. ක්‍රි. පූ. 167 පමණ මකබිවරුන්ගේ කැරැල්ල සාර්ථක විය. ඒ අනුව ඇන්ටිසොකස් එපිහනස්ගේ හෙලනිස්තකරණ ව්‍යාපාරය අවසන් විය.

### රෝම යුගය

මකබි කැරලි නිම වී ජුදා වරුන් තම ආගමික නිදහස ලබා ජීවත් විය. ක්‍රි. පූ. 63 දී රෝමානු සෙනෙවියකු වූ ගායුස් සමඟ පැමිණි රෝම හමුදාව විසින් පලස්තීනය යටත් කරගන්නා ලදී. ඒ පරිපාලනයේ දී සීසර් අධිරාජ්‍යයා මහ හෙරෝද් ක්‍රි. පූ. 37 දී පලස්තීනයේ ආණ්ඩුකරු ලෙස පත් කළේ ය. ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත සිදු වූයේ මහ හෙරෝද් රජුගේ අවසන් කාලයේ දී ය. ක්‍රි. පූ. 6-4 අතර ජෙරුසලමේ බෙත්ලෙහෙම නම් කුඩා ග්‍රාමයක ක්‍රිස්තු උපත සිදු විය. මහ හෙරෝද්ගේ මරණය සිදුවූයේ යැයි සැලකෙන්නේ ක්‍රි. පූ. 4-2 අතර කාලයක ය. ඒ කාලයේ නව ගිවිසුම බිහිවෙයි. පදනම දැමූ යුගය ලෙස කිව හැකිය. ඒ පසුබිම අධ්‍යයනයේ පහසුව සඳහා පැතිකඩ 4 කින් විමසා බැලීම වැදගත් වේ.

1. දේශපාලන බලය
2. ආර්ථික තත්ත්වය හා ජීවනෝපාය
3. සමාජීය පසුබිම
4. ආගමික වන්දනාව

### 1. දේශපාලන බලය

ක්‍රිස්තුස් වහන්සේ ගේ කාලයේ පලස්තීනයේ මුළු ජන සංයුතිය මිලියන 1.5 ත් 2.0 අතර සංඛ්‍යාවකි. පාලන බලය අත්පත් කරගෙන සිටියේ රෝමවරුන්ය. රෝමයේ අධිරාජ්‍යයා විසින් රාජ්‍ය පාලනය සඳහා ආණ්ඩුකාරවරු යටතට බලය පවරන ලදී. ජෝර්දාන් නදියෙන් බටහිර ප්‍රදේශ හා ගලීලයෙන් දකුණු ප්‍රදේශය වන සමාරිය ජුදය හා ඉදුමිය එක් ප්‍රදේශයකි. එහි පරිපාලනය සඳහා අධිරාජ්‍යයා විසින් 5 වන ආණ්ඩුකරු ලෙස පොන්සියස් පිලාත් පත්කරන ලදී. ජෝර්දාන් නදියෙන් නැගෙනහිර ප්‍රදේශය හා ගලීලයට උතුරු ප්‍රදේශ එනම් ගලීලය හා පෙරයාව ආදී ප්‍රදේශ පරිපාලනය සඳහා සෙන්හෙඩ්‍රින් සභාව හෙවත් ජුදා මන්ත්‍රණ සභාව ද සම්බන්ධ විය. ආගමික මූලස්ථානය වූ ජෙරුසලම් දේවමාලිගාවේ මෙන් ම සෙන්හෙඩ්‍රින් සභාවේ මූලාසනය හොබවන ලද්දේ උත්තම පූජකයා විසිනි. රෝමානු අධිරාජ්‍යයාට පක්ෂපාතව සිටි පිරිසක් ලෙස හෙරෝදිවරුන් පෙන්වා දිය හැකිය. ඔවුන් සැම විටම අධිරාජ්‍යයට ඇති පක්ෂපාතකම නිසා

ආණ්ඩුකාරවරුන්ට කේවට්ටකම් කළ පිරිසකි. ඔවුහු වැඩිපුර වාසි ලබා ගැනීම සඳහා එසේ කළෝය. සැම විටම ඔවුන්ගේ අපේක්ෂාව වූයේ ආණ්ඩුකරු හෙරෝද් පෙළපතින් පැවත එන්නකු වීම ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට ද මොවුන් එරෙහි විය.

**2. ආර්ථික තත්ත්වය හා ජීවනෝපාය**

පලස්තීන ජනතාවගේ ප්‍රධාන ජීවනොපාය ලෙස ගොවි, ධීවර, එඬේර, වෙළඳාම හා කම්කරු ලෙස පෙන්වා දිය හැකිය. ආර්ථික තත්ත්වය අනුව ජනතාව සමාජ පන්තීන් දෙකකට වෙන් විය. එනම් ඉඩම් හිමි ධනවතුන් හා කය වෙහෙසා වැඩ කටයුතු කරන නිර්ධන කොටස ය. ගලීල මුහුද ආශ්‍රිත ප්‍රචලිත වූයේ ධීවර කර්මාන්තයයි. එඬේර වංශයේ නියැලුණු අය සමාජ පිළිගැනීමට ලක් නොවූ අතර ධීවරයන් ද එසේම විය. රෝමානු අධිරාජ්‍යයා විසින් පලස්තීන වැසියන්ට අධික බදු බරක් පටවා තිබුණි. මේ හේතුවෙන් ජනතාවගේ ජීවන තත්ත්වය පහත් මට්ටමක පැවතුණි. ජනතාව බදු වර්ග දෙකක් ගෙවිය යුතු ය.

1. දේව මාලිගාවේ බද්ද, 2. අධිරාජ්‍යයාට ගෙවන බද්ද

**දේව මාලිගාවේ බද්ද**

කම්කරුවකු දින දෙකකට ලබන වැටුප වන ඩ්‍රැක්මා කාසි දෙකක් ෂෙකෙල් කාසිවලට මාරු කර දේව මාළිගාවට දැමිය යුතු ය. කිසිදු කාසි වර්ගයක් දැමිය නොහැකිය. ෂෙකෙල් කාසි පමණක් දැමිය යුත්තේ ය. වෙනත් කාසිවල රෝමය අධිරාජ්‍යයා වන සීසර්ගේ රූපය සටහන් වී තිබීම ය. දේව මාලිගාව අවට මුදල් මාරු කරන්නෝ වූහ. ක්‍රිස්තුස් වහන්සේ ඒ මුදල් මාරු කරන්නන් සමග ද අරගල කළේ ඔවුන් වංචනික ලෙස මුදල් මාරු කරන බැවිනි. පලස්තීන වැසියන් සාමාන්‍ය ජීවිතයේ දී භාවිත කළ මුදල් වර්ග දෙකකි.

1. රෝම දිනාර් කාසි, 2. ග්‍රීක ඩ්‍රැක්ම කාසි

**අධිරාජයාට ගෙවිය යුතු බද්ද**

ජුදෙව් ජනතාව තම නිෂ්පාදන විකුණන ලබන ආදායමෙන් රෝම අධිරාජයාට බදු ගෙවිය යුතුය. ඒ බදු අය කිරීමට අධිරාජයා නිළධාරීන් පත්කර තිබුණි. ඔවුහු බදු අයකරන්නන්, අයකැමියන්, සුංගම් අයකරන්නන් ලෙස විවිධ නම්වලින් හැඳින්වුණහ. ඒ පිරිස අධිරාජයාට පක්ෂපාත පිරිසකි. ඔවුන්ගේ බදු අයකිරීමේ අසාධාරණ ක්‍රියාවන් නිසා ජුද ජනතාව අධික ලෙස පීඩාවට පත්වූහ.

**සමාජීය පසුබිම**

ජුද සමාජ පසුබිම තුළ විවිධ සමාජ තරාතිරමේ ජනතාවක් විය. මොවුන් අන් ප්‍රධාන කාණ්ඩායම් දෙකකට අයත් වේ. 1. සමාජය පිළිගත් ජන පිරිස. ඒ පිරිස ඉඩම් හිමියන්, ධනවතුන්, පූජකවරුන්, පරිසිවරුන්, සද්දුසිවරු හා විනයධරයන් ලෙස පෙන්වා දිය හැකිය. 2. සමාජය පිළිනොගත් ජන පිරිස. ඒ පිරිස දුගීන්, අයකැමියන්, කාන්තාවන්, වහලුන්, සමරිතානුවරුන්, එඬේරුන්, කම්කරුවන්, රෝගීන් ලෙස පෙන්වා දිය හැකිය.

**අයකැමියෝ**

මේ කණ්ඩායමට රෝමානු අධිරාජයාට ජනතාවගෙන් බදු එකතු කළ පිරිසකි. මොවුන් බදු අයකිරීමේදී සාධාරණ බවින් තොරව වංචනිකව බදු එකතු කළහ. පමණ ඉක්මවා බදු අයකර රෝම අධිරාජයාට ලබාදී අධිරාජයාගෙන් වාසි බලාපොරොත්තු වූහ. එනිසා ජුදාවරු ඒ පිරිස ජාතිද්‍රෝහීන් ලෙස සලකා කොන් කළෝය. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ ඒ පිරිසටද දයානුකම්පිතව දැක්වූ සේක. ඔවුන් පිළිගෙන ඔවුන්ව නිවැරදි යහපත් මඟකට ගැනීමට උත්සාහ දැරූ සේක. සකේවුස් නම් ලත් අයකැමියාගේ නිවසට පිවිස ආහාර අනුභව කළ සේක. ලෙවී ලෙස නම් කළ මතෙව් නම් අයකැමියා හට ආරාධනා කර තම ශ්‍රාවක සමූහයට එක්කර ගත් සේක. මෙලෙස ක්‍රිස්තුස් වහන්සේ අයකැමියාව ප්‍රතික්ෂේප නොකොට ඔවුන්ටද කරුණාව දැක්වූ සේක.


**කාන්තාවෝ**

ජුදා සමාජයේ කාන්තාවට හිමි වූයේ ඉතා පහත් ස්ථානයකි. පුරුෂාධිපත්‍යය මූලිකවූ ජුදා සමාජයේ කාන්තාවට අයිතිවාසිකම් හිමි වූයේ නැත. දික්කසාදය, රැකියාවක් කිරීම, අධිකරණයක සාක්ෂි දීම, අධ්‍යාපනය ලැබීම, ආගමික ස්ථානවල කටයුතු සඳහා ඉදිරිපත් වීමට අයිතිවාසිකමක් නොතිබිණි. කාන්තාවක් වැන්දඹුවක වූ විට අන්ත අසරණ තත්ත්වයට පත් වේ. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ලබා දීමට කටයුතු කළ සේක. මාර්තා සහ මරියා සමග එකතු වී ඔවුන්ට ඉගැන්වීමට ඉදිරිපත් වූ සේක. සමරිතානු ළඳ සමග කථා කරමින් ජලය ඉල්ලා ගත් සේක. රෝගී කාන්තාවට ඉඩ දුන් සේක. ඒ අනුව ක්‍රිස්තුස් වහන්සේ කාන්තාවට යහපත් ස්ථානයක් දී ඇත.

සටහන

**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**





**EVERYBODY CAN WIN,**

හැමෝටම දිනන්ඩ පුළුවන්

**Awaken your true self**

විද්‍යාත්මක ක්‍රම මගින් ඔබව හදුනාගන්න

ඔබගේ,

- ආයතනයේ
- වැඩපලේ
- පාසැලේ,
- දේවස්ථානයේ
- දහම් පාසැලේ

දරුවන්ට, ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ තරුණයන්ට විශේෂ වැඩසටහන්

මෙහෙයවීම:

**Prasanna Wijesinghe Ph.D**

*Ph.D. in Management (USA), MHRM (Kelaniya), MA.in Philosophy,(Kelaniya), B.Ph.(Rome), B.Th.(Rome), NLP (SL), NLP (UK)*

e-mail: prasanna@bridgetobridge.lk

web: www.bridgetobridge.lk

Reserve your session now

0770 10 11 12




We nurture human capabilities and values in a collaborative environment through a holistic education process.

**UNDERGRADUATE PROGRAMMES**
**With Guaranteed Internships**

APPROVED UGC APPROVED APPROVED

## School of Business

- Bachelor of Business Management Honours
- BBM Hons in Accounting and Finance
- BBM Hons in Marketing Management
- BBM Hons in Human Resource Management

## School of Computing

- BSc Hons in Information Technology
- BSc Hons in Software Engineering
- BSc Hons in Computer Science

## School of Education

- BEd Hons in Primary Education
- BEd Hons in Early Childhood Education
- BEd Hons in Teaching English as a Second Language
- BSc Hons in Counselling Psychology & Psycho-Social Support *

## International Degree Programmes

- NCC UK Foundation Programme

* To be launched with the next intake

**PROFESSIONAL QUALIFICATIONS**
**For Enhanced Employability**

## Academy of Professional Studies

- Certificate / Diploma in Digital Marketing
- Teaching Knowledge Test (TKT) - Cambridge
- Certificate/ Diploma in Counselling

## Academy of English

- Spoken English
- Aquinas Diploma in English

## Short Courses in Computing

- Certificate / Advanced Certificate in ICT
- Certificate / Advanced Certificate in Graphic Design
- Certificate in Hardware Engineering
- Certificate in Computer Networking
- Certificate in Data Science *
- Certificate in Computer Science *
- Certificate in Software Engineering *
- Certificate in Python Programming *
- Certificate in IT and Cybersecurity Law *
- Certificate in Java Application Development *

**How to**
# Enroll ?

▶ Scan to Apply
▶ Inquire for more details
info@bci.lk

Contact us
**031 222 4422 | 070 603 5100**
**Benedict XVI Catholic Institute of Higher Education**
495, Minuwangoda Road, Bolawalana, Negombo
**www.bci.lk**



මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2023